# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,447 — 2006 මැයි 26 වැනි සිකුරාදා — 2006.05.26

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
| --- | --- |
| තනතුරු - ඇබෑර්තු … … … … | 584 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … | 588 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ජූනි මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 මැයි මස 19 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිළධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථොක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථොක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලිම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

5. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වු කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිළධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රේදි කැළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු – ඇබෑර්තු

## රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### පොත් බැඳුම්කරු තනතුරුවලට බඳවා ගැනීම

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ පොත් බැඳුම්කරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙයින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් කොළඹ දී මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

03. *සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. දායක විශ්‍රාම වැටුප් අරමුදල යටතේ දායක විශ්‍රාම වැටුපකට හිමිකම් ඇත.

(ii) 2003.01.01 දිනට පෙර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දැරූ අයෙකු මෙම තනතුරට බඳවා ගනු ලැබුවහොත් එවැනි අයෙකුට තවදුරටත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ඇති අතර, වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති ද, අදාල වේ.

(iv) රාජ්‍ය සේවයට ඇතුළුවන නවක නිලධාරීන් අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වන්නේ ය.

(v) තනතුරකට පත්වී වසර 3ක් ගතවීමට පෙර, කාර්යක්ෂතා කඩඉම සමත්විය යුතුය. වයස පදනම් කරගෙන කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු නොලැබේ.

04. *වැටුප් බණ්ඩය හා පරිමාණය.*– TB-2-1 රු. 1,01,880 – 14 x 1,320 - 6 x 1,560 – රු. 1,29,720 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 9/2004.

05. *වයස් සීමාව.*– වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

06. *අධ්‍යාපන සුදුසුකම්* :

(i) බාහිර අයදුම්කරුවන් සඳහා,

(i) (අ) දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම. (එකවර විෂයයන් 05ක් වත් සමත් විය යුතුය.) ; හෝ

(ආ) දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හයකින් ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයෙන් සමත්වීම. (එකවර විෂයන් 05ක් වත් සමත් විය යුතුය.) සමග පොත් බැඳීම පිළිබඳ වසර 03ක පළපුරුද්ද ; හෝ

(ii) 8 ශ්‍රේණිය (9 වසර) සමත්වීම සමග පොත් බැඳීම පිළිබඳ වසර 06 (හයක) පළපුරුද්ද.

(ii) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වර්ෂ 08ක හෝ එයට වැඩි කාලයක ස්ථිර සහ සතුටුදායක සේවා කාලයක් ඇති, කාර්යාල සේවක සේවයේ I හා Iඒ පන්තිවල සේවකයින් හෝ II පන්තියේ වසර 06ක සේවා කාලයක් සහිත සේවකයින් විය යුතුය.

(i) පුරප්පාඩු සංඛ්‍යාව සඳහා මෙම සුදුසුකම් ඇති සේවකයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වසර 08ක හෝ ඊට වැඩි සේවා කාලයක් සහිත ඉන් කා. සේ. සේ. II වන පන්තියේ වසර 03ක සේවා කාලයක් ද සම්පූර්ණ කර ඇති සේවකයන් සලකා බලනු ලැබේ.

(ii) සතුටුදායක සේවා කාලයක් යන්නෙන් අදහස් කරනු ලබන්නේ පූර්වාසන්න පස් අවුරුදු සේවා කාලය තුළදී සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති අවවාද කිරීමකට වැඩි දඬුවමක් නො ලැබූ සේවා කාලයකි.

07. *බඳවා ගැනීමේ ක්‍රමය.*– පුරප්පාඩු සංඛ්‍යාවෙන් 75%ක් බාහිර අයදුම්කරුවන්ගෙන් ද 25%ක් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් ද බඳවාගනු ලැබේ.

(i) බාහිර අයදුම්කරුවන් :

(අ) රජයේ *ගැසට් පත්‍රයේ* හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා සුදුසුකම් සහිත අයදුම්කරුවන් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් හා රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් වැඩිම ලකුණු ලබාගත් අය සුදුස්සන් හැටියට තෝරාගනු ලැබේ.

(ආ) ප්‍රායෝගික පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ විෂය නිර්දේශය හා ලකුණු පරිපාටිය ඇමුණුම 02 ලෙස දක්වා ඇත.

(ii) අභ්‍යන්තර අයදුම්කරුවන් :

(අ) සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන්, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් හා රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් වැඩිම ලකුණු ලබාගත් අය සුදුස්සන් හැටියට තෝරාගනු ලැබේ.

(ආ) ප්‍රායෝගික පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ විෂය නිර්දේශය හා ලකුණු පරිපාටිය ඇමුණුම 03 ලෙස දක්වා ඇත.

08. මෙම නිවේදනයේ පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2006.06.26 දින හෝ එදිනට පෙර, රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, අංක 280, කෙළින් වීදිය, කොළඹ 11 යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

09. ඉල්ලුම්පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ "රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ පොත් බැඳුම්කරු තනතුරට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍රය සෑම ආකාරයෙන්ම සම්පූර්ණ විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර ඉල්ලුම්පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපි හෝ තැපෑලේදී නැති වූ බවට කරන පැමිණිලි සලකා බලනු නොලැබේ.

10. රජයේ සේවයේ/පළාත් පාලන සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම් පත්‍රය, තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය.

11. තමා දැනුවත්ව ඉදිරිපත් කරන ලද යම්කිසි තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ අයදුම්කරු හිතාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත් හෝ එසේ නැතහොත් නුසුදුසු බව සේවය කරන කාලය තුළ කවර අවස්ථාවකදී හෝ ඔප්පු වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමට සමත් වනු ඇත.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2006 මැයි මස 08 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 280, කෙළින් වීදිය,
කොළඹ 11.

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### පොත් බැඳුම්කරු තනතුර සඳහා අයදුම්පත්‍රය

01. (i) මුල'කුරු සමඟ නම :———.
(ii) මුල'කුරු වලින් හැඳින්වෙන නම් :———.

02. (i) පෞද්ගලික ලිපිනය :———.
(ii) කාර්යාලීය ලිපිනය :———.

03. ජාතික හැඳුනුම්පත් අංකය :———.

04. උපන් දිනය :
වර්ෂය :———, මාසය :———, දිනය :———.
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න.)

05. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :———, මාස :———, දින :———.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :———.

07. විවාහක/අවිවාහක භාවය :———.

08. අධ්‍යාපන සුදුසුකම් (අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණන්න.) :————.
(i) පොත් බැදීම පිළිබඳ පළපුරුද්ද (සහතිකවල පිටපත් අමුණන්න.) :————.

09. ඔබ උසාවියක් ඉදිරියේ කිසියම් චෝදනාවකට වරදකරු වී ඇද්ද ? :————.
ඔව්/නැත (පිළිතුර ඔව් නම් විස්තර සපයන්න.)

10. *අයදුම්කරුගේ සහතිකය* :

(i) මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව අවංකවම ප්‍රකාශ කරමි.

(ii) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට පමණයි.)* :

මෙම ඉල්ලුම්කරු වන ............................ මහතා මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරයි. ඔහු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත/තාවකාලික තනතුරක් දරයි. පසුගිය වසර .................... ක කාලය තුළ වේතනාධික සියල්ල උපයාගෙන ඇත. ඔහුගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායකය. ඔහු මොනයම් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) යටත්කොට නොමැති බව ද, ඔහු මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් නිදහස් කරන/නොකරන බවද මින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
පදවි නාමය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————.

05–336

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු

### අනුරාධපුරය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුයි.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයට ඉල්ලුම් කළ හැකිය

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතුයි.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2006 ජූලි මස 03 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2006 මැයි මස 04 වැනි දින,
කොළඹ 11, කෙළින් වීදිය, අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අනුරාධපුරය | නැගෙනහිර නුවරගම් පළාත | අනුරාධපුර නව නගරය කොට්ඨාශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම් අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් අනුරාධපුරය |

05-364

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු

### ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුයි.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයට ඉල්ලුම් කළ හැකිය

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතුයි.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2006 ජූනි මස 26 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2006 මැයි මස 03 වැනි දින,
කොළඹ 11, කෙළින් වීදිය, අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කාර්යාලය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | බද්දේගම | ගාල්ල දිස්ත්‍රික්කයේ තෙලිකඩ කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ ගහබඩ පත්තුව කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්, අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, ගාල්ල. |
| ගාල්ල | කරන්දෙනිය | ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙනිය බටහිර උප්පැන්න මරණ සහ වැල්ලබඩ පත්තුව විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | එම |
| ගාල්ල | බලපිටිය | ගාල්ල දිස්ත්‍රික්කයේ බටහිර වලල්ලාවිට කෝරළයේ කොට්ඨාශයේ (හැගල්ල ප්‍රදේශයේ) අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | එම |
| ගාල්ල | බෙන්තොට | ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිට කෝරළයේ කොට්ඨාශයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | එම |

05-363

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය

**2007/2009 කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (ප්‍රවේශ විභාගය)**

2007/2009 දැවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කරගැනීමේ තරග විභාගයක් විභාග දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2006 සැප්තැම්බර් මස පහත සඳහන් මධ්‍යස්ථානවලදී පවත්වනු ලැබේ.

| *මධ්‍යස්ථාන අංකය* | *මධ්‍යස්ථානය* | *මධ්‍යස්ථාන අංකය* | *මධ්‍යස්ථානය* |
|---|---|---|---|
| (1) | අනුරාධපුරය | (7) | මහනුවර |
| (2) | බදුල්ල | (8) | කුරුණෑගල |
| (3) | මඩකලපුව | (9) | මාතර |
| (4) | කොළඹ | (10) | ත්‍රිකුණාමලය |

| මධ්‍යස්ථාන අංකය | මධ්‍යස්ථානය | මධ්‍යස්ථාන අංකය | මධ්‍යස්ථානය |
|---|---|---|---|
| (5) | ගාල්ල | (11) | වවුනියාව |
| (6) | යාපනය | (12) | රත්නපුරය |
| | | (13) | හම්බන්තොට |

කිසියම් මධ්‍යස්ථානයක් සඳහා අවශ්‍ය තරම් විභාග අපේක්ෂකයන් අයදුම්කොට නොමැති විට ඔවුන්ගේ දෙවෙනි කැමැත්ත අනුව හෝ අයදුම් කොට ඇති මධ්‍යස්ථානයට සමීප වෙනත් මධ්‍යස්ථානයක් හෝ ඔවුන්ට නියම කෙරෙනු ඇත.

02. *දැවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවට තෝරා ගැනීම* :

2.1 කෘෂිකර්මය පිළිබඳ මෙම පාඨමාලාව ගැහැණු පිරිමි දෙපක්ෂයටම විවෘතය. මෙම විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අය කුසලතාවය හා දිස්ත්‍රික් පදනම මත කුණ්ඩසාලේ, පැල්වෙහෙර, අඟුණකොළපැලැස්ස සහ වවුනියාව යන කෘෂිකර්ම විද්‍යාල හතරට තෝරා ගනු ලැබේ. තවද අනුරාධපුර හා කරපිංච කෘෂිකර්ම විද්‍යාලවල කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

2.2 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවල පවත්වනු ලබන කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇත. මෙම පුහුණුව හුදෙක් වෘත්තීයමය වන අතර, එය පිළියෙල කරනු ලැබ ඇත්තේ පුහුණුවෙන් පසු ස්වයං රැකියාවල යෙදීමට හෝ සුදුසු රැකියාවක් ලබා ගැනීමට හෝ බලාපොරොත්තු වන කාන්තාවන්ට හා පුරුෂයන්ට ය. පාඨමාලාව හදාරන කාලය තුළදී නේවාසික පහසුකම් සපයනු ලැබේ. ශිෂ්‍යයින්ට මෙම කාලය තුළදී වෙනත් කිසිදු ආයතනයක පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන පුහුණු පාඨමාලාවක් හැදෑරීමට හෝ රැකියාවක් ලබා ගැනීමට හෝ අවසර දෙනු නොලැබේ. කිසියම් ශිෂ්‍යයෙක්/ශිෂ්‍යාවක් කිසියම් අවස්ථාවක එවැනි පාඨමාලාවක් හදාරන බව හෝ වෙනත් කිසියම් ආයතනයක රැකියාවක නියුක්ත බව හෝ ඔප්පු වුවහොත් ඔහු/ඇය කෘෂිකර්ම විද්‍යාලයෙන් නෙරපනු ලැබේ.

2.3 සෙනසුරාදා සහ ඉරිදා දිනවල ද සමහර විට පන්ති පවත්වන බැවින් නේවාසිකාගාරවලින් බැහැරව යා හැක්කේ මසකට එක් සති අන්තයකදී පමණය. මඩ කුඹුරුවල, ගොඩ ගොවිතැන්වල ප්‍රායෝගිකව යෙදීමට මනාපයක් තිබිය යුතුය. මෙම පුහුණුවෙන් පසු රැකියා අවස්ථාවන් වැඩි වශයෙන් බලාපොරොත්තු විය හැක්කේ වියලි කලාපයේ ගම්බද පළාත්වල බැවින් එම ප්‍රදේශවල සේවය කිරීමට අයදුම්කරුවන්ට කැමැත්තක් තිබිය යුතුය.

03. *ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම්* :

3.1 (*අ*) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය යන විෂයයන් දෙකෙන් එකකටවත් සම්මාන සාමාර්ථය ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන හතරක් (04) තිබිය යුතුය.) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 ක් අ. පො. ස. (සා. පෙ.) සමත්වීම. මෙයින් අනිවාර්ය කර ඇති විෂයන්ට සම්මාන 03ක් සහිතව අවම වශයෙන් විෂයයන් 05 ක් එකවර, සමත්වී තිබීම ;

සහ

(*ආ*) අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා අංශයේ විෂය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන් හයෙන් එකක් සමත් වී තිබීම. (උසස් පෙළ සඳහා ගණිතය විෂය ධාරාව හැදෑරූ සිසුන් රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව සමත් වී සිටීම මෙම පාඨමාලාවට සුදුසුකම් ලැබුවා සේ නොසැලකේ.) ;

(*ඇ*) ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හදාරන්නේ නම් අ.පො.ස. (සා. පෙ.) ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් තිබිය යුතුය.

3.2 2006.07.07 දිනට අපේක්ෂකයාගේ වයස අවුරුදු 17 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 25 ට වැඩි නොවිය යුතුය.

3.3 3.1 හා 3.2 හි සඳහන් ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් ප්‍රවේශමෙන් කියවා බැලීමට අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති හා/හෝ නියමිත වයස් සීමාවෙන් බැහැර වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

3.4 ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් අයදුම්පත් එවීම කළ නොහැක. දැනට රජයේ දෙපාර්තමේන්තුවක හෝ ආයතනයක, දැවුරුදු කෘෂිකර්ම පාඨමාලාවන් හදාරන සිසුන් මෙම පාඨමාලාව හැදෑරීමට අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

3.5. කෘෂිකර්ම විද්‍යාලයේ උගන්වන මාධ්‍ය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි බැවින් එම භාෂාවන් අතුරින් එක් භාෂාවකින් එම පාඨමාලාව හදාරා පාඨමාලාවේ විභාගයන්ට පෙනී සිටීමට අපේක්ෂකයාට හැකිවිය යුතුය. තෝරාගත් මාධ්‍යයෙන් දිගටම අධ්‍යයන කටයුතු කළ යුතුය. පාඨමාලාව අතර මගදී ඉගෙනුම ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

3.6 ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වනු ලබන්නේ කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ පමණි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගැනීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන්ට තරග විභාගය සඳහා තමන් කැමති මාධ්‍යයකින් පෙනී සිටිය හැක. එහෙත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් I වන හා II ප්‍රශ්න පත්‍රවලට අමතරව III වන ප්‍රශ්න පත්‍රයට ද පෙනී සිටිය යුතු ය. ඉංග්‍රීසි මාධ්‍යය සඳහා බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 30 කි. පාඨමාලාව සඳහා තෝරාගනු ලබන සෑම ශිෂ්‍යයෙක්ම ආරම්භයේ දී තමන් විසින් තෝරා ගන්නා ලද මාධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු හා විභාග කටයුතු කළ යුතු අතර පසු අවස්ථාවක දී ඉගෙන ගන්නා මාධ්‍ය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. *අයදුම්පත් :*

4.1 මෙම දැන්වීම අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර අයදුම්කරුවන්ගේ අත් අකුරුවලින් හෝ යතුරු ලියනය කර 8" × 12" ප්‍රමාණයේ (A 4 ප්‍රමාණයේ) කඩදාසියක දෙපැත්තේ තම අයදුම්පත සකස් කළ යුතුය. එහි අංක 01 සිට අංක 11 දක්වා මුල් පිටුවේ අඩංගු කළ යුතුවේ. අසම්පූර්ණව පුරවා ඇති හා ආදර්ශ ආකෘතිය අනුව සකස් නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

4.2 විභාග ගාස්තුව ලෙස විභාග කොමසාරිස් ජනරාල්ගේ 4000-20-03-20-13 ආදායම් ශීර්ෂයට බැරවන සේ දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත් රුපියල් 250 ක් වටිනා මුදල් කුවිතාන්සියක් ලබාගෙන නොගැලවෙනසේ අයදුම්පතේ අදාළ ස්ථානයට ඇලවිය යුතුය. කුවිතාන්සියේ ඡායා පිටපතක් තමා වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගයට ගෙවන ලද ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැක. විභාග ගාස්තුවල කුවිතාන්සිය අයදුම්පත් සමග ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

4.3 සියළුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2006 ජුලි මස 07 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ, අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.තැපෑලේදී ප්‍රමාද වන හෝ නැතිවන අයදුම්පත් ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

4.4 අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවර 2007/2009 "කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්වීම" යන්න හා පළමුවන හා දෙවන තේරීම් වශයෙන් තෝරා ඇති හා විභාග මධ්‍යස්ථානවල නම් පැහැදිලිව සඳහන් කරන්න.

05. *තෝරා ගැනීමේ පිළිවෙල :*

5.1 ලිඛිත විභාගයේ කුසලතා ලකුණුවල එකතුව මත සහ දිස්ත්‍රික් පදනම මත තේරීම් කරනු ලැබේ. සාමාන්‍ය පෙළ විභාගයට පළමු වරට පෙනී සිටි දිස්ත්‍රික්කය අයදුම්පතේ සඳහන් කිරීමේ දී එම දිස්ත්‍රික්කයට අදාළ අංකය සොයා ගැනීම සඳහා මෙම *ගැසට් නිවේදනයේ* අවසානයට පළකර ඇති ඇමුණුම් අංක 01 උපයෝගී කර ගන්න. අවසාන වශයෙන් පාඨමාලාවට සිසුන් තෝරා ගැනීමට එක් එක් දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික් මට්ටමින් වැඩිම ලකුණු ලබාගත් සිසුන් සීමිත ගණනකට සහතිකපත් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ඇත. දිස්ත්‍රික් පදනම සඳහා සලකා බැලීමේ දී අයදුම්කරු අයත් දිස්ත්‍රික්කය ලෙස සලකනු ලබන්නේ, අයදුම්කරු අ. පො. ස. (සා.පෙළ) විභාගයට පළමු වරට පෙනී සිටි පාසැල අයත් දිස්ත්‍රික්කයයි.

5.2 ලිඛිත විභාගය සඳහා වූ විෂයයන්, හා කාල සටහන පහත සඳහන් වේ :

| *විෂයයන්* | *කාලය* | *කාල සටහන* |
|---|---|---|
| (i) *ප්‍රශ්න පත්‍රය*<br>කෘෂිකර්මය<br>(ලකුණු 100 යි)<br>(අ. පො. ස. (සා. පෙළ)<br>කෘෂිකර්ම විෂය<br>නිර්දේශය අනුව<br>සකස් කළ බහුවරණ<br>හා කෙටි ප්‍රශ්න අඩංගු වේ) | පැය 1 යි | පෙ. ව. 9.30 - පෙ. ව. 10.30 |
| (ii) *ප්‍රශ්න පත්‍රය*<br>බුද්ධි පරීක්ෂණය<br>(ලකුණු 100 යි) | පැය 1 යි | පෙ. ව. 11.00 - මධ්‍යාහ්න 12.00 |
| (iii) *ප්‍රශ්න පත්‍රය*<br>ඉංග්‍රීසි භාෂාව<br>(ලකුණු 100 යි)<br>අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි විෂය නිර්දේශය<br>අනුව සකස් කෙරේ. ඉංග්‍රීසි භාෂාවෙන්<br>කරුණු අවබෝධ කර ගැනීම, ඉංග්‍රීසියෙන්<br>අදහස් සංනිවේදනය කිරීමේ හැකියාවන් හා<br>සරල ව්‍යාකරණ හැකියාවන් පරීක්ෂා කෙරේ | පැය 1 යි | ප. ව. 13.30 - ප. ව. 14.30 |

5.3 ප්‍රශ්න පත්‍ර I හා ප්‍රශ්න පත්‍ර II සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40 ක් වත් ලබාගත යුතු වේ. යම් මාධ්‍යයක් සඳහා මෙම අවම ලකුණු ලබාගත් විභාග අපේක්ෂකයින් නොසිටින විටකදී පමණක් එම මාධ්‍යයෙන් කෘෂිකර්ම විද්‍යාලවලට අවශ්‍ය අයදුම්කරුවන් ප්‍රමාණය තෝරා ගැනීම සඳහා අවශ්‍ය වුවහොත් මෙම අවම සීමාවන් වෙනස් කිරීමට ඉඩ ඇත. එම ප්‍රශ්න පත්‍ර දෙකේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන් දිස්ත්‍රික් පදනම මත තෝරාගෙන මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. තෝරා ගැනීම අනිවාර්යෙන්ම ලබාගත් වැඩිම ලකුණු මට්ටම අනුව හා අනුමත කර ඇති ක්‍රමයක් අනුව දිස්ත්‍රික්ක පදනම මත, සිදු කෙරේ. අදාළ වර්ෂයේ දී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කර ගනු ලබන පිරිමි හෝ ගැහැණු සිසුන් සංඛ්‍යාව එම විද්‍යාලවල පිරිමි හෝ ගැහැණු නේවාසිකාගාරවල ඇති ඉඩකඩ අනුව හා එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් අනුව තීරණය කරනු ඇත. කිසියම් දිස්ත්‍රික්කයක අවශ්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව නොමැති විටක විද්‍යාලවලට උපරිම සිසුන් ප්‍රමාණයක් ඇතුළත් කිරීම සඳහා අනෙකුත් දිස්ත්‍රික්කවලින් අවශ්‍ය සිසුන් සංඛ්‍යාවක් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයන් විසින් තම සහතිකපත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ. කෘෂිකර්ම විද්‍යාලවලට තෝරා ගනු ලබන සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

5.4 සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් අනිවාර්යයෙන් තමන් පාඨමාලාව හැදෑරීමට තෝරාගත් භාෂා මාධ්‍යයෙන්ම තරග විභාගයේ දී පළමු හා දෙවන ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතුය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට අයදුම්කරන අයදුම්කරුවන් පමණක් තම මනාපය අනුව සිංහලෙන් හෝ දෙමළෙන් පළමුවන හා දෙවන ප්‍රශ්නපත්‍ර වලට පෙනී සිටිය හැක. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පමණක් ඒ සඳහා සුදුසුකම් ලැබීමට ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට පෙනී සිට, අවම වශයෙන් 50% ක් ලකුණු ලබාගත යුතු වේ. ඉංග්‍රීසි විෂය සමත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටින අවස්ථාවලදී පමණක් මෙම අවම සීමාවන් වෙනස් කිරීමට ඉඩ ඇත. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා කුසලතාවය මත හා අනුමත කර ඇති ක්‍රමයක් අනුව දිස්ත්‍රික් පදනම මත තේරීම සිදු කරනු ලැබේ. එහිදී ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට, පළමුවන හා දෙවන ප්‍රශ්න පත්‍රවලට අවම සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයින් අතරින් පළමු වන ප්‍රශ්න පත්‍රය හා දෙවන ප්‍රශ්න පත්‍රයේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබාගෙන ඇති අපේක්ෂකයින් පමණක් කුසලතා මත තෝරාගනු ලැබේ.

5.5 3.1 සහ 3.2 ඡේදයන්හි සඳහන් සුදුසුකම් ඇති සියලුම අයදුම්කරුවන්ට විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රවේශපත්‍ර එවනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග මධ්‍යස්ථානයේ අදාළ භාර නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතුය. විභාගය පැවැත්වීමට නියමිත දිනට සති දෙකකට පෙර විභාග දෙපාර්තමේන්තුව මගින් ජාතික පුවත්පත්වල පළකරනු ලබන පුවත්පත් දැන්වීමක් මගින් විභාගය පවත්වන දිනය ප්‍රසිද්ධ කරනු ලැබේ. ඒවන විට ප්‍රවේශපත්‍රය ලැබී නොමැති යම් අයදුම්කරුවෙකු වේ නම් එම පුවත්පත් දැන්වීමේ සඳහන් ආකාරයට විභාග දෙපාර්තමේන්තුව අමතා තම ප්‍රවේශ පත්‍රය ලබාගැනීමට කටයුතු කිරීම සුදුසු වේ.

5.6 විභාගය පැවැත්වෙන අවස්ථාවේ දී අයදුම්කරුවන් විසින් තම අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත ඔප්පු කර සිටිය යුතුයි. මේ සඳහා පහත දැක්වෙන ලියකියවිලි වලින් එකක් පිළිගත හැක :

*(අ)* පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම් පත,

*(ආ)* විභාග දිනයට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බල පත්‍රයක්,

5.7 විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ප්‍රසිද්ධ ලිඛිත විභාගවලට බලපාන නීති හා කොන්දේසිවලට අයදුම්කරුවන් අවනත විය යුතුය. විභාග දෙපාර්තමේන්තුව මගින් සිසුන් ලබාගත් ලකුණු ඔවුන්ගේ ලිපිනයන්ට දන්වා එවනු ඇත. දිස්ත්‍රික් මට්ටමින් වැඩිම ලකුණු ලබාගත් සිසුන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. මෙම ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම හෝ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට ඉඩදීම අපේක්ෂකයාගේ සුදුසුකම් පිළිගත් බවක් නොහැගේ. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන් පසුව හෝ යන කවර අවස්ථාවකදී වුවත් මෙම ව්‍යවස්ථාවන් අනුව නුසුදුසු යයි තීරණය වන අයදුම්කරුවකුගේ විභාගපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

5.8 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අපේක්ෂයින්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

06. *"කුසුමා ලක්ෂ්මී කරුණාතිලක" සිහිවටන ශිෂ්‍යත්වය* :

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේදී I හා II ප්‍රශ්න පත්‍ර දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගත් අයදුම්කාරියට ඉහත ශිෂ්‍යත්වයේ කොන්දේසිවලට යටත්ව වර්ෂ දෙකක් සඳහා මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබේ. ශිෂ්‍යත්වලාභියාට කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ඉගෙනුම ලැබීමට අවස්ථාව දෙනු ලැබේ. මෙම ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රු. 10,000 වේ.

ආචාර්ය සී. කුඩාගමගේ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

*ඇමුණුම් අංක 01*

දිස්ත්‍රික්කවල නම් හා ඒවාට අයත් අංක
(5 . 1 ඡේදයට අදාළ වේ)

| *දිස්ත්‍රික් අංක* | *දිස්ත්‍රික්කය* |
|---|---|
| 01 | අනුරාධපුරය |
| 02 | බදුල්ල |
| 03 | මඩකලපුව |
| 04 | කොළඹ |
| 05 | ගාල්ල |
| 06 | යාපනය |
| 07 | මහනුවර |
| 08 | කුරුණෑගල |
| 09 | මාතර |
| 10 | ත්‍රිකුණාමලය |
| 11 | වව්නියාව |
| 12 | රත්නපුරය |
| 13 | හම්බන්තොට |
| 14 | ගම්පහ |
| 15 | කළුතර |
| 16 | මාතලේ |
| 17 | නුවරඑළිය |
| 18 | මන්නාරම |
| 19 | මුලතිව් |
| 20 | අම්පාර |
| 21 | පුත්තලම |
| 22 | පොළොන්නරුව |
| 23 | මොණරාගල |
| 24 | කෑගල්ල |
| 25 | කිලිනොච්චිය |

*ආදර්ශ ඉල්ලුම් පත්‍රය*

*ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය - 2007/2009*

(බැඳුම් තීරුව සඳහා අඟලක් ඉඩ හැරිය යුතුයි. එහි කිසිවක් නොලිය යුතුයි)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

1. විභාගයට පෙනී සිටින මධ්‍යස්ථානය
   1. වන තේරීම .................
   2. වන තේරීම .................

එහි අංකය
.............
.............

(ගැසට් පත්‍රයේ මුල් ඡේදයට අනුව)

2. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල මාධ්‍ය - 2
දෙමළ මාධ්‍ය - 3

භාෂා මාධ්‍යයට අදාළ අංකය
.............

3. පාඨමාලාව හැදෑරීමට කැමති මාධ්‍ය
සිංහල මාධ්‍ය - 2
දෙමළ මාධ්‍ය - 3
ඉංග්‍රීසි මාධ්‍ය - 4

කැමති මාධ්‍යයට අදාළ අංකය
..............

(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

4. ස්ත්‍රී/පුරුෂ භාවය

| | |
|---|---|
| පුරුෂ - 0 | ...... |
| ස්ත්‍රී - 1 | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5. සාමාන්‍ය පෙළ විභාගයට ප්‍රථම වරට පෙනී සිටි පාසල පිහිටි දිස්ත්‍රික්කය
...........................................................

දිස්ත්‍රික් අංකය
.............

(5.1 ඡේදයට අනුව)

6. (අ) (i) මුලකුරු සමග නම :―――――,
(පැහැදිලි අකුරින්) :

(ii) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :―――――.
උදා . SILVA, A.C.

(ආ) (i) මුලකුරු වලින් හැඳින්වෙන නම් :―――――.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරු වලින්) :―――――.

7. (i) සම්පූර්ණ ලිපිනය :―――――.
(ii) විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු සම්පූර්ණ ලිපිනය :―――――.
(ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්)
(iii) සම්බන්ධ කරගත හැකි දුරකථන අංකය (ඇතොත්) :―――――.

8. දිස්ත්‍රික්කය :

(අ) දැනට පදිංචි දිස්ත්‍රික්කය :―――――.

(ආ) අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි පාසල හා ලිපිනය :―――――.

(ඇ) පළමු වරට අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය :―――――.

9. *(අ)* පදිංචි මැතිවරණ කොට්ඨාසය (සිංහලෙන්) :―――――.

*(අ)* මැතිවරණ කොට්ඨාසය (ඉංග්‍රීසියෙන්) :―――――.

10. උපන් දිනය : අවුරුද්ද: [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

11. 2006.07.07 දිනට වයස : අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

12. (අ) නිවේදනයේ 3.1 ඡේදය අනුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයන් හය හෝ ඊට වැඩි ගණන :

| *විභාග අංකය* | *වර්ෂය සහ මාසය* | *සමත් විෂයයන්* | *විෂය අංකය* | *සමත් ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| | | සිංහල | | |
| | | ගණිතය | | |
| | | විද්‍යාව | | |
| | | කෘෂිකර්මය | | |
| | | සමාජ අධ්‍යයනය | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

(ආ) ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව සම්මාන ශ්‍රේණියේ සාමාර්ථයන් ලබාගැනීම අනිවාර්ය කර ඇති විෂයයන් හතර පිළිබඳ විස්තර:

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| 1. | | 1. සිංහල | | |
| 2. | | 2. ගණිතය | | |
| 3. | | 3. විද්‍යාව | | |
| 4. | | 4. කෘෂිකර්මය | | |
| 5. | | 5. සමාජ අධ්‍යයනය | | |

(ඇ) අ.පො.ස. (උ.පෙළ) විභාගය ජීව විද්‍යා විෂය ධාරාවන් හදාරා ඇත්ද ? ඔව්/නැත (අදාල නොවන වචනය කපා හරින්න.)
(ඈ) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් සමත් විෂයයන්

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. ජීව විද්‍යාව | | |
| | | 2. කෘෂි කර්මය | | |
| | | 3. භෞතික විද්‍යාව | | |
| | | 4. රසායනික විද්‍යාව | | |
| | | 5. සත්ත්ව විද්‍යාව | | |
| | | 6. උද්භිද විද්‍යාව | | |

(ඉ) ඉහත සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම්පත්‍රයට අමුණා එවන්න. (මුල් පිටපත් එවිය යුතු නොවේ.)

සහතික වල ඡායා පිටපත් අමුණා තිබේද? :―――――.

13. (i) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :―――――.
(ii) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :―――――.
(ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්)

14. මුදල් ගෙවූ කුවිතාන්සි පිළිබඳ විස්තර :

14.1 මුදල් කුවිතාන්සි අංකය හා දිනය :―――――.
14.2 මුදල් කුවිතාන්සිය ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :―――――.

| |
|---|
| මුදල් ගෙවූ කුවිතාන්සියේ උඩ කොටසේ තීරුවක පමණක් මැලියම් ගා මෙහි අලවන්න. කුවිතාන්සියක ඡායා පිටපතක් අනිවාර්යයෙන්ම ඔබ ළඟ තබාගන්න. |

*අයදුම්කරුගේ ප්‍රකාශය :*

මා විසින් මෙම අයදුම් පතෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවටත් මෙයින් සහතික කරමි. අ.පො.ස (සා.පෙළ) සමත් බවත් සිංහල, විද්‍යාව, ගණිතය යන විෂයන්ට සම්මාන සාමාර්ථයන් ඇති බවත් සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය යන විෂයයන් දෙකකින් එකකට සම්මාන සාමාර්ථයක් ඇති බවත් හා උසස් පෙළ ජීව විද්‍යා විෂය ධාරාවන් හදාරා ගැසට් නිවේදනයේ නම් කර ඇති විෂයන් එකක් හෝ ඊට වැඩි ගණනක් සමත් වී ඇති බවට සහතික වෙමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෝ හෙළි වුවහොත්, මා තරඟ විභාගයට පෙනී සිටීමට හා කෘෂිකර්ම විද්‍යාලයට තෝරා ගැනීමට නුසුදුස්සෙකු වන බව මම දනිමි. මෙම විභාගය සඳහා වූ සියලුම නීතිරීති පිළිපැදීමට මම එකඟ වෙමි.

―――――,
අයදුම්කරුගේ අත්සන.

දිනය :―――――.

*අත්සන සහතික කිරීම*

දෙපාර්තමේන්තුවක හෝ පාසැලක ප්‍රධානියෙක්, සාමදාන විනිශ්චයකාරවරයෙක්, නීතිඥයෙක් හෝ රුපියල් 1,42,500 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු විසින් මෙම අයදුම් පත්‍රය සහතික කළ යුතුයි.

ඉහතින් අත්සන් කර ඇති ....................මයා./මිය./මෙනෙවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි.

————,
අත්සන සහතික කරන අයගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————,
නම :————,
නිල නාමය :————,
ලිපිනය :————.

05-360

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ගුරු අධ්‍යාපනය පිළිබඳ පූර්ව සේවා වෘත්තීය පාඨමාලාවක් හැදෑරීම සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කරගැනීම - 2007

1.0 ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක ගුරු අධ්‍යාපනය පිළිබඳ තුන් අවුරුදු පූර්ව සේවා වෘත්තීය පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය ශාස්ත්‍රීය සුදුසුකම් හා යෝග්‍යතාවය ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

***2.0 යෝග්‍යතාව*** :

සෑම අයදුම්කරුවකුම, –

2.1 ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි ;
2.2 විශිෂ්ඨ චරිතයකින් ද, මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය;
2.3 වයස :
2.3.1 2007.01.01 දිනට වයස අවුරුදු 25 ට නොවැඩි විය යුතුයි.
2.3.2 බුද්ධ ධර්මය පාඨමාලාවට ඉල්ලුම් කරන බෞද්ධ භික්ෂූන් වහන්සේලා 2007.01.01 දිනට වයස අවුරුදු 27 ට නොවැඩි විය යුතුය;
2.3.3 කතෝලික/ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාවට අයදුම්කරන පූජකවරුන් සඳහා 2007.01.01 දිනට වයස අවුරුදු තිහට (30) නොවැඩි විය යුතුයි ;
2.4 අවිවාහක විය යුතුයි.

3.0 *මූලික අධ්‍යාපන සුදුසුකම්* :

3.1 2005 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී විෂයය තුනකින් (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා විෂයය දෙකකින්) එකවර සමත්වීම.
(තාක්ෂණ අධ්‍යයන පාඨමාලාවේ ඉල්ලුම්කරුවන් 4.14 ඡේදයේ සැලකිය යුතුයි යන වගන්තිය ද කතෝලික/ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාවේ පූජකවරුන් 4.10 ඡේදයේ සැලකිය යුතුයි යන වගන්තිය ද කියවන්න)

3.2 අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී/මූලික පිරිවෙන් අවසාන විභාගයේ දී ගණිතය සිංහල/දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී (පළමු අවස්ථාවේ දී විෂයය 5 කින්) සම්මාන තුනක් සහිතව සමත්වීම.

3.3 ඒ ඒ පාඨමාලාවට අදාළ අ. පො. ස. (සා. පෙළ) විභාගයේ විශේෂ සුදුසුකම් ඉහත 3.2 පරිදි දෙවරක දී සම්පූර්ණ නොවේ නම් තුන්වැනි වාරයේ දී සම්පූර්ණ කර තිබිය යුතුය. සියලුම සුදුසුකම් ඉල්ලුම් පත්‍රය භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

3.4 ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන පාඨමාලාවලට ඉල්ලුම්කරන්නේ නම් අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍ය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

4.0 *අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් විශේෂ අවශ්‍යතා.–* ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පැවැත්වෙන එක් එක් පාඨමාලාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් විශේෂ අවශ්‍යතා පහත දැක්වේ.

4.1 පාඨමාලා අංකය 01- ප්‍රාථමික අධ්‍යාපනය :

4.1.1 2005 වර්ෂයේ පවත්වන ලද අ. පො.ා ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයය තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා විෂයය දෙකකින්) එකවර සමත්වීම; හා

4.1.2 සිංහල/දෙමළ භාෂාවට හා තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව ගණිතය ඇතුළු විෂයයන් 6න් අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත්වීම.

4.2 පාඨමාලා අංකය – 02 - i විද්‍යාව (සිංහල)
02 ii විද්‍යාව (දෙමළ)
02 - iii විද්‍යාව (ඉංග්‍රීසි)

4.2.1 2005 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සහ ජීව විද්‍යාව යන විෂයයන්ගේ (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා ඉහත විෂයයන් අතුරින් විෂයය දෙකකින්) එකවර සමත්වීම; හා

4.2.2 සිංහල/දෙමළ භාෂාවට සාමාර්ථය හා 32 ගණිතය හෝ 42 ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

4.3 පාඨමාලා අංකය – 03 - i ගණිතය (සිංහල)
03 - ii ගණිතය (දෙමළ)
03 - iii ගණිතය(ඉංග්‍රීසි)

4.3.1 2005 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස (උ. පෙළ) විභාගයේ දී ගණිතය, සංයුක්ත ගණිතය, උසස් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, යන විෂයයන්ගෙන් විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා ගණිතය, සංයුක්ත ගණිතය, උසස් ගණිතය, යන විෂයයන්ගෙන් එකක්ද ඇතුළුව විෂයය දෙකකින් ) එකවර සමත්වීම; හා

4.3.2 සිංහල/දෙමළ භාෂාවට සාමාර්ථය හා 34 විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයය හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

4.4 පාඨමාලා අංකය 04 - i ශාරීරික අධ්‍යාපනය (සිංහල)
04 - ii ශාරීරික අධ්‍යාපනය(දෙමළ)
04 - iii ශාරීරික අධ්‍යාපනය (ඉංග්‍රීසි)

4.4.1 2005 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය තුනකින් එකවර සමත්වීම; හා
4.4.2 සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයය හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම; හා
4.4.3 පිළිගත්, ජවන හා පිටිය මළල ක්‍රීඩා හා සංවිධානාත්මක ක්‍රීඩා පිළිබඳ නිපුනත්වයක් ලබා තිබීම.

විවිධ ක්‍රීඩා/ඉසව් තුනකට උපරිම වශයෙන් ලකුණු 75 ක් ප්‍රදානය කිරීම පහත දැක්වෙන අනුපිළිවෙලට සිදු කරනු ලැබේ :-

ක්‍රීඩා/ඉසව් ප්‍රමුඛතා අනුපිළිවෙල

| *අනු අංකය* | *මට්ටම/විෂයය* | *කේවල* | *සමූහ* | *ස්ථානය/ ශ්‍රේණිය* | *ලකුණු* |
|---|---|---|---|---|---|
| 1 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 1 | 25 |
| 2 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 2 | 24 |
| 3 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 3 | 23 |
| 4 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 1 | 22 |
| 5 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 2 | 21 |
| 6 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 3 | 20 |
| 7 | අන්තර් ජාතික නියෝජනය | කේවල | සමූහ | | 19 |

| අනු අංකය | මට්ටම/විෂයය | කේවල | සමූහ | ස්ථානය/ ශ්‍රේණිය | ලකුණු |
|---|---|---|---|---|---|
| 8 | ජාතික මට්ටම | කේවල | - | 1 | 18 |
| 9 | ජාතික මට්ටම | කේවල | - | 2 | 17 |
| 10 | ජාතික මට්ටම | කේවල | - | 3 | 16 |
| 11 | ජාතික මට්ටම | - | සමූහ | 1 | 15 |
| 12 | ජාතික මට්ටම | - | සමූහ | 2 | 14 |
| 13 | ජාතික මට්ටම | - | සමූහ | 3 | 13 |
| 14 | පළාත් මට්ටම | කේවල | - | 1 | 12 |
| 15 | පළාත් මට්ටම | කේවල | - | 2 | 11 |
| 16 | පළාත් මට්ටම | කේවල | - | 3 | 10 |
| 17 | පළාත් මට්ටම | - | සමූහ | 1 | 09 |
| 18 | පළාත් මට්ටම | - | සමූහ | 2 | 08 |
| 19 | පළාත් මට්ටම | - | සමූහ | 3 | 07 |
| 20 | රෙජිමේන්තු සැරයන් මේජර්/බළලත් නිලධාරී 1 | - | - | - | 06 |
| 21 | ජනාධිපති බාලදක්ෂ/බාලදක්ෂිකා | - | - | - | 06 |
| 22 | සාජන්ට් මේජර්/බළලත් නිලධාරී 2 | - | - | - | 05 |
| 23 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 1 | 06 |
| 24 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 2 | 05 |
| 25 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 3 | 04 |
| 26 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 1 | 03 |
| 27 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල . | - | සමූහ | 2 | 02 |
| 28 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 3 | 01 |

4.4.4 අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය විෂයයට පෙනී සිට සාමාර්ථයන් ලැබී ඇත්නම් පහත සඳහන් පරිදි අතිරේක ලකුණු හිමි වේ.

A සාමාර්ථය - 4
B සාමාර්ථය - 3
C සාමාර්ථය - 2
S සාමාර්ථය - 1

*සැලකිය යුතුයි* :

(i) *පිළිගත් ක්‍රීඩා තරඟ (අන්තර් ජාතික ).* – අධ්‍යාපන අමාත්‍යාංශ/ක්‍රීඩා අමාත්‍යාංශය, සහ ඒවායේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් (වෙස්, කැරම්, දාම් හැර ) ශ්‍රී ලංකාවේ ජාතික කණ්ඩායම් හෝ පාසල් ජාතික ක්‍රීඩා කණ්ඩායම් නියෝජනය කරමින් සහභාගිවන අන්තර් ජාතික තරඟ (පාසැල් ක්‍රීඩා කණ්ඩායම් පෞද්ගලිකව සහභාගිවන අන්තර් ජාතික තරඟ සලකා නොබැලේ.)

(ii) *පිළිගත් ක්‍රීඩා තරඟ.* – අධ්‍යාපන අමාත්‍යාංශය/ ක්‍රීඩා අමාත්‍යාංශය / ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන ජාතික මට්ටමේ ක්‍රීඩා තරඟ.

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන පළාත් මට්ටමේ ක්‍රීඩා තරඟ.

පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය / ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩා තරඟ.

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන අධ්‍යාපන කලාප මට්ටමේ ක්‍රීඩා තරඟ.

(iii) ක්‍රීඩා අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි හා පිළිගත් ක්‍රීඩා සංගම් මගින් සංවිධානය කරන ලද ඒ ශ්‍රේණියේ තරඟවල 1, 2 හා 3 වන ස්ථානවලට පමණක් අනුපිළිවෙලින් ප්‍රමුඛතාව දෙනු ලැබේ.

(iv) ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනයට පූර්වයෙන් වූ වර්ෂ 5 තුළ ලබාගත් ක්‍රීඩා නිපුණතා මේ සඳහා වලංගු වේ.

(v) ක්‍රීඩා සහතික තුනකට ලකුණු දීමේ දී ලකුණු හිමිවන්නේ එකම ඉසව්වකට" එකම වසරකදී ලබාගත් සහතිකවලින් එක් ඉහළම සහතිකයකට පමණි.

(vi) ක්‍රීඩා සහතික තුනකට ලකුණු ලබාදීමට අමතරව 4.4.4 යටතේ සුදුසුකම් ලබා තිබේනම් ඒ අනුව නියමිත ලකුණක් ද හිමි වේ.

4.5 *පාඨමාලා අංක 05* – i ගෘහ ආර්ථික විද්‍යාව හා ආහාර තාක්ෂණය (සිංහල)
ii ගෘහ ආර්ථික විද්‍යාව හා ආහාර තාක්ෂණය (දෙමළ)

4.5.1 2005 වර්ෂයේ පැවැත් වූ අ.පො. ස (උ.පෙළ) විභාගයේ දී, ගෘහ ආර්ථික විද්‍යාව ඇතුළුව විෂයයන් තුනකින් එකවර සමත්වීම; හා

4.5.2 විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/දෙමළ භාෂාව, ගණිතය ද ඇතුළුව විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත්වීම.

4.6 පාඨමාලා අංක 06 – ඉංග්‍රීසි :

4.6.1 2005 වර්ෂයේදී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි (සාමාන්‍ය ඉංග්‍රීසි නොවේ) ඇතුලුව විෂයය තුනකින් එකවර සමත්වීම, හා ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන /ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ද, සිංහල /දෙමළ භාෂාවට හා ගණිතය ද ඇතුලුව විෂයය හයකින් අ.පො.ස. (සා. පෙ.) විභාගයෙන්/ලන්ඩන් අ.පො.ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම; හෝ

4.6.2 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් එකවර සමත්වීම හා 2005 වර්ෂයේ දී පවත්වන ලද ලන්ඩන් අ.පො. ස (උ.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි ඇතුලුව විෂයයන් තුනකින් සමත්වීම සහ අ.පො. ස. (සා. පෙළ) විභාගයෙන් /ලන්ඩන් අ.පො. ස. (සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන /ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හා සිංහල /දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුලුව විෂයයන් හයකින් සමත්වීම ; හෝ

4.6.3 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් එකවර සමත්වීම හා අ.පො. ස. (සා.පෙළ) විභාගයෙන් /ලන්ඩන් අ.පො. ස. (සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හා සිංහල / දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුලුව විෂයයන් හයකින් අ.පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

සැලකිය යුතුයි. :

(i) තෝරා ගැනීමේ දී ඉංග්‍රීසි පාඨමාලාවේ 4.6.1 හා 4.6.2 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමි වේ. ඔවුන් ප්‍රවීණතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු නැත. සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් තහවුරු කළ යුතුය.

(ii) 4.6.3 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන් ප්‍රවීණතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය.

4.7 පාඨමාලා අංකය 07 – බුද්ධ ධර්මය :

බුද්ධ ධර්ම පාඨමාලාවට බෞද්ධ භික්ෂූන් වහන්සේලාට ද ගිහි අයදුම්කරුවන්ට ද, ඉල්ලුම් කළ හැකි ය. සියලුම අවශ්‍යතා 2004 වසරේ හෝ ඊට පෙර සම්පූර්ණකර තිබිය යුතුය. (ගිහි අයදුම්කරුවන්ගේ සියලුම අධ්‍යාපන සුදුසුකම් 2005 හෝ ඊට පෙර ගිහි නමින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.)

4.7.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස (උ.පෙළ) විභාගයේ දී බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ඨාචාරය, හා පාළි, යන විෂයයන්ගෙන් එකක් ඇතුලුව විෂයයන් තුනකින් එකවර සමත්වීම, (2008 වර්ෂයේදී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල බුද්ධ ධර්මය පාඨමාලාවට සිසුන් ඇතුලත් කරගැනීමේදී අ.පො.ස. (උසස් පෙළ) සිංහල භාෂාව සමත්වීම සුදුසුකමක් ලෙස සැලකේ).

4.7.2 ප්‍රාචීන, ප්‍රාරම්භ විභාගයෙන් සමත්වීම (බෞද්ධ භික්ෂූන් වහන්සේලාට පමණි)

4.7.3 බෞද්ධ ධර්මාචාර්ය විභාගයෙන් සමත්වීම,

4.7.4 දහම් පාසල් අවසාන විභාගය සමත්වීම,

4.7.5 සිංහල භාෂාව, බුද්ධ ධර්මය හා ගණිතය, ඇතුලු විෂයයන් හයකින් අ.පො. ස. (සා.පෙළ) /සිංහල භාෂාව ගණිතය, ත්‍රිපිටක ධර්මය ඇතුලු විෂයයන් හයකින් මූලික පිරිවෙන් අවසාන විභාගයෙන් සමත්වීම.

සැලකිය යුතුයි :

(i) තෝරාගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල –

(අ) 4.7.1., 4.7.2, 4.7.3, 4.7.4, 4.7.5 යන සියලුම සහතික ඇති අයදුම්කරුවන්,

(ආ) 4.7.1 4.7.2, සහ 4.7.5 සහතික ඇති අයදුම්කරුවන්,

(ඉ) 4.7.1, 4.7.3 සහ 4.7.5 සහතික ඇති අයදුම්කරුවන්,
(ඊ) 4.7.1, 4,7.4, 4.7.5 සහතික ඇති අයදුම්කරුවන්,
(උ) 4.7.1 සහ 4.7.5 සහතික ඇති අයදුම්කරුවන් )

4.8 *පාඨමාලා අංකය 08 – හින්දු ධර්මය:*

4.8.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී එකවර හින්දු ධර්මය, හින්දු ශිෂ්ඨාචාරය හා සංස්කෘත යන විෂයයන්ගෙන් විෂයය එකක් ඇතුලුව විෂයයන් තුනකින් සමත්වීම,
4.8.2 ශෛව සිද්ධාන්ත පණ්ඩිතර් සහතිකය ලබා තිබීම,
4.8.3 ශෛව පුලවර් සහතිකය ලබා තිබීම,
4.8.4 ඉලං ශෛව පුලවර් සහතිකය ලබා තිබීම,
4.8.5 දෙමළ භාෂාව, ගණිතය සහ හින්දු ධර්මය ඇතුලු විෂයයන් 6කින් අ.පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

(සැලකිය යුතුයි :
තෝරාගැනීමේ අනුපිළිවෙල :–

අ. 4.8.1, 4.8.5 සහ අනිකුත් සියළුම සහතික හිමි අයදුම්කරුවන්

ආ. 4.8.1, 4.8.5, 4.8.4 සහ අනිකුත් සහතික දෙකෙන් එකක් ලැබූ අයදුම්කරුවන්

ඉ. 4.8.1, 4.8.5 සහ අනිකුත් සහතික තුනෙන් එකක් ලැබූ අයදුම්කරුවන්

ඊ. 4.8.1, 4.8.5 සහතික ලැබූ අයදුම්කරුවන්

ඉහත සඳහන් සියළුම අවශ්‍යතා 2005 වර්ෂයේ දී හෝ ඊට පෙර ලබා තිබිය යුතුයි.)

4.9 පාඨමාලා අංකය 09 – ඉස්ලාම් ධර්මය :

4.9.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී ඉස්ලාම් ධර්මය, ඉස්ලාම් ශිෂ්ඨාචාරය සහ අරාබි යන විෂයයන්ගෙන් එකක් ඇතුලුව විෂයයන් තුනකින් එකවර සමත්වීම,
4.9.2 අල්- ආලිම් විභාගය ( 1 වන කොටස හා 2 වැනි කොටස යන දෙකින්ම ) සමත්වීම,
4.9.3 මෞලවි සහතිකය ලබා තිබීම හා අල් ආලිම් විභාගය 1 වන කොටස සමත්වීම.
4.9.4 මෞලවි සහතිකය ලබා තිබීම.
4.9.5 දෙමළ භාෂාව, ගණිතය සහ ඉස්ලාම් ධර්මය ඇතුලු විෂයයන් 6කින් අ.පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

(සැලකිය යුතුයි:
තෝරාගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල:

අ. 4.9.1, 4.9.5 සහ ඉහත සියලුම සහතික හිමි අයදුම්කරුවන්

ආ. 4.9.1, 4.9.5, 4.9.3 සහ 4.9.4 සහතික හිමි අයදුම්කරුවන්

ඉ. 4.9.1, 4.9.5 සහ 4.9.4 සහතික හිමි අයදුම්කරුවන්

උ. 4.9.1 සහ 4.9.5 සහතික හිමි අයදුම්කරුවන්

ඉහත සඳහන් සියලුම අවශ්‍යතා 2005 වර්ෂයේදී හෝ ඊට පෙර ලබා තිබිය යුතුයි.)

4.10 පාඨමාලා අංක 10 – කතෝලික ධර්මය / ක්‍රිස්තියානි ධර්මය :

4.10.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී විෂයයන් තුනකින් එකවර සමත්වීම හා දේව ධර්මය පිළිබඳ පාඨමාලාව (බී. ටී. එච්. ) හදාරා තිබීම; හෝ

4.10.2 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේදී ක්‍රිස්තු ධර්මය ඇතුලු එකවර විෂයයන් තුනකින් සමත්වීම හා ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන කතෝලික දහම්ගුරු සහතිකය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය ලබා තිබීම; හෝ

4.10.3 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී එකවර විෂයයන් තුනකින් සමත්වීම හා දේව ධර්ම නිකේතනය මගින් පවත්වනු ලබන කතෝලික ධර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම; හෝ

4.10.4. 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී එකවර විෂයයන් තුනකින් සමත්වීම හා කතෝලික රදගුරු පදවි මට්ටමෙන් පවත්වනු ලබන කතෝලික දහම් ගුරු සහතිකය ලබා තිබීම; හෝ

4.10.5 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී එකවර විෂයයන් තුනකින් සමත්වීම හා පිළිමතලාව ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය මගින් පවත්වනු ලබන ධර්මවේදී ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම; හෝ

4.10.6 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී එකවර විෂයයන් තුනකින් සමත්වීම හා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය මගින් පවත්වනු ලබන ආගමික දැනුම පිළිබඳ ජාතික සහතිකය (ධර්මාචාර්ය ) ලබා තිබීම; හා

4.10.7 සිංහල/දෙමළ භාෂාව, ගණිතය සාමාර්ථය ද සහ ක්‍රිස්තු ධර්මය හෝ ක්‍රිස්තු ධර්මය (රෝමානු කතෝලික ) විෂයයන්ට සම්මාන සාමාර්ථයන් ඇතිව විෂයයන් 6කින් අ.පො. ස. (සා.පෙ.) විභාගයෙන් සමත්වීම.

(සැළකිය යුතුයි .–

(i) බඳවා ගන්නා මුළු සංඛ්‍යාවෙන් 85% ක් තෝරාගැනීම සඳහා 4.10.1, 4.10.2, 4.10.3, 4.10.4 යන සහතිකවලට අනුපිළිවෙලින් ප්‍රමුඛත්වය දී කතෝලික ධර්මය අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(ii) බඳවා ගන්නා මුළු සංඛ්‍යාවෙන් 15% ක් තෝරාගැනීම සඳහා 4.10.5, 4.10.6 සහතිකවලට අනුපිළිවෙලින් ප්‍රමුඛත්වය දී ක්‍රිස්තියානි ධර්මය අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කඳවනු ලැබේ.

(iii) බඳවා ගන්නා මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් 40% කතෝලික හා ක්‍රිස්තියානි පූජක පක්ෂයෙන් තෝරා ගනු ලැබේ. පූජක පක්ෂයේ අයදුම්කරුවන් අතර 2005 වර්ෂයේ අ .පො. ස. (උසස් පෙළ) සමත්වූ අයදුම්කරුවන් අවශ්‍ය සංඛ්‍යාව නොමැති නම් 2004, 2003, 2002 වර්ෂවල අ.පො.ස (උසස් පෙළ) සමත්වූ පූජක පක්ෂයේ අයදුම්කරුවන්ගෙන් තෝරා ගනු ලැබේ. 40% ක පූජක පක්ෂයේ අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා ගිහි අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(iv) ඉල්ලුම්පත්‍රයේ පාඨමාලාවේ නම ලියන ස්ථානයේ කතෝලික ද, ක්‍රිස්තියානි ද යන්න සඳහන් කළ යුතුය.)

4.11 පාඨමාලා අංක 11 – පුස්තකාල විද්‍යාව හා තොරතුරු අධ්‍යයනය :

4.11.1. 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙ) විභාගයේ දී විෂයයන් තුනකින් එකවර සමත්වීම; හා

4.11.2 ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන / ඉංග්‍රීසි සාහිත්‍ය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/ දෙමළ භාෂාව හා ගණිතය ඇතුලුව විෂයයන් 06කින් අ.පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම.

4.12 පාඨමාලා අංකය 12 – විශේෂ අධ්‍යාපනය :

4.12.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් එකවර සමත්වීම; හා
4.12.2 සිංහල/දෙමළ භාෂාව, ගණිතය, ඇතුලුව විෂයයන් 06කින් අ.පො. ස. ( සා.පෙළ) සමත්වීම.

4.13 පාඨමාලා අංකය 13 – කෘෂිකර්මය :

4.13.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙ) විභාගයේ දී කෘෂි විද්‍යාව ඇතුලුව විෂයයන් තුනකින් එකවර සමත්වීම ; හා
4.13.2 ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව සිංහල/දෙමළ භාෂාව ඇතුලු විෂයය 6 කින් අ.පෙ. ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම.

4.14 පාඨමාලා අංකය 14 – තාක්ෂණ අධ්‍යයනය :

4.14.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විෂයයන් තුනකින් එකවර සමත්වීම; හා
4.14.2 අ.පො. ස. (සා.පෙ.) සාමාර්ථය.

4.14.2.1 ඉදිකිරීම් තාක්ෂණය-

ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ද, ලී වැඩ/මේසන් වැඩ/ඉදිකිරීම් තාක්ෂණය යන විෂයයන්ගෙන් එකක් ද ඇතුලුව විෂයයන් 6 කින් අ.පො. ස. (සා.පෙළ) විභාගයෙන් සමත්වීම; හෝ

4.14.2.2 යාන්ත්‍රික තාක්ෂණය :

ගණිතය සහ සිංහල/ දෙමළ භාෂාව ද, ලෝහ වැඩ,/මෝටර් කාර්මික ශිල්පය/යාන්ත්‍රික තාක්ෂණය යන විෂයයන්ගෙන් එකක් ද ඇතුලුව විෂයයන් 6 කින් අ.පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම; හෝ

4.14.2.3 විදුලිය හා ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය :

ගණිතය සහ සිංහල/ දෙමළ භාෂාව ද, ගුවන් විදුලි කාර්මික ශිල්පය / විදුලි හා ඉලොක්ට්‍රොනික තාක්ෂණය යන විෂයයන්ගෙන් එකක් ද ඇතුලුව විෂයයන් 6 කින් අ. පො. ස (සා. පෙළ) විභාගයෙන් සමත්වීම; හෝ

4.14.2.4 කලාශිල්ප තාක්ෂණය :

ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ද, විවීම/ මැටි ශිල්පය /කලා ශිල්ප යන විෂයයන්ගෙන් එකක් ද ඇතුලුව විෂයයන් 6 කින් අ.පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම; හා

4.14.3 රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක / ජාතික ආධුනිකත්ව මණ්ඩලය/ වෘත්තීය පුහුණු අධිකාරිය/ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව / කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව යන ආයතන මගින් පවත්නා විෂයය සාධන මට්ටම දැක්වෙන විධිමත් සහතික නිකුත් කරනු ලබන මාස 10ට නොඅඩු විෂයය ක්ෂේත්‍රයට අදාළ ශිල්පීය පාඨමාලාවක් හදාරා සාර්ථකව නිමකර තිබීම.

4.14.4 නොවිධිමත් අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයක ඉහත පාඨමාලාවලට සම්බන්ධ පාඨමාලාවක් හදාරා සාර්ථකව නිමකර තිබීම.

*(සැලකිය යුතුයි.* :

(i) තෝරාගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල :

(අ) 4.14.1 – 4.14.2 – 4.14.3 සහතික ඇති අයදුම්කරුවන්,
(ආ) 4.14.1 හා 4.14.3 සහතික ඇති අයදුම්කරුවන්,
(ඉ) 4.14.1 හා 4.14.2 හා 4.14.4 සහතික ඇති අයදුම්කරුවන්.
(ඊ) 4.14.1 හා 4.14.2 සහතික ඇති අයදුම්කරුවන්

(ii) ඉල්ලුම් පත්‍රයේ ඉදිකිරීම් තාක්ෂණය / යාන්ත්‍රික තාක්ෂණය/ විදුලි ඉලෙක්ට්‍රොනික තාක්ෂණය /කලා ශිල්ප යන්න පැහැදිලිව සටහන් කළ යුතුය.

(iii) ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනට හෝ ඊට පෙර ඉහත දැක්වෙන සියලු අවශ්‍යතා සම්පූර්ණකර තිබිය යුතුය.

(iv) අයදුම්පත්‍රය ඉදිරිපත් කර ඇත්තේ ඉහත (1) හි සඳහන් (අ), (ආ) හා (ඉ) ප්‍රමුඛතා අනුපිළිවෙලින් කුමක් යටතේ ද යන්න ඉල්ලුම් පත්‍රයෙහි අංක 17.0 යටතේ ඇති "ශිල්පීය පාඨමාලාවේ නම" සඳහන් කොටුවේ ලියන්න.

(v) 2005 වර්ෂයේ අ.පො.ස උසස් පෙළ සමත් සහ 4.14.3 සුදුසුකම් සපුරා ලූ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් 2004 සහ 2003 වර්ෂවල දී අ.පො. ස. (උ.පෙ.) සමත්ව 4.14.3 සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ.)

**4.15** පාඨමාලා අංක 15 – චිත්‍ර කලාව

4.15.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ .පො. ස. (උ.පෙ.) විභාගයේ දී චිත්‍රකලා විෂයය ඇතුලු විෂයයන් තුනකින් එකවර සමත්වීම හා චිත්‍ර, ගණිතය, සිංහල / දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් 6කින් අ.පො. ස. (සා. පෙ.) විභාගය සමත්වීම.

4.15.2 2005 වසරේ අ.පො. ස. (උ.පෙ) විභාගයේ දී චිත්‍ර/චිත්‍ර හා මූර්ති විෂය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

සැලකිය යුතුයි.

(i) 4.15.1 යටතේ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත්වී නොමැති නම් 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙ) විභාගයේ දී විෂයයන් තුනකින් එකවර සමත්වීම ;හා

සිංහල/දෙමළ භාෂාව ගණිතයට සාමාර්ථය ද, චිත්‍ර කර්මය සම්මාන සාමාර්ථ්‍යයක් ද ඇතුලු විෂයය හයකින් අ.පො.ස. (සා. පෙ.) විභාගයෙන් සමත් වූ ඉල්ලුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

*4.16 පාඨමාලා අංක 16 –නැටුම් (පෙරදිග)/ නැටුම් (භරත )*

4.16.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී පෙරදිග නැටුම්/භරත නැටුම් ඇතුළු විෂය තුනකින් (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට විෂය දෙකකින් ) එකවර සමත්වීම.

4.16.2 2005 වසරේ අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී නැටුම් (පෙරදිග)/නැටුම් (භරත) විෂය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

4.16.3 සිංහල/ දෙමළ භාෂාව ගණිතය හා පෙරදිග නැටුම්/ භරත නැටුම් ඇතුළු විෂයයන් 06කින් අ.පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

සැලකිය යුතුයි

(i) ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ. පෙ.) විභාගයේ දී එකවර විෂයයන් දෙකකින් සමත්ව අ.පො. ස. (සා.පෙ.) විභාගයේ දී භරත නැටුම් විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ.

4.17 පාඨමාලා අංකය 17 – සංගීතය (පෙරදිග) / සංගීතය (කර්ණාට)

4.17.1. 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙ.) විභාගයේ දී පෙරදිග සංගීතය/ කර්ණාට සංගීතය ඇතුළු විෂයයන් තුනකින් (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට විෂය දෙකකින් ) එකවර සමත්වීම; හා

4.17.2 2005 වසරේ අ.පො. ස. ( උ.පෙ.) විභාගයේ දී සංගීතය(පෙරදිග) සංගීතය (කර්ණාට) විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

4.17.3 සිංහල / දෙමළ භාෂාව, ගණිතය හා පෙරදිග සංගීතය / කර්ණාට සංගීතය ඇතුළු විෂයයන් 06කින් අ.පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

(සැලකිය යුතුයි) (i) ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාල සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙ.) විභාගයේ දී එකවර විෂයයන් දෙකකින් සමත්ව අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී කර්ණාට සංගීතය විෂයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ.)

4.18. පාඨමාලා අංකය 18 - බටහිර සංගීතය

4.18.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී බටහිර සංගීතය ඇතුළු විෂයයන් තුනකින් එකවර සමත්වීම හා

ඉංග්‍රීසි භාෂාව අධි සම්මාන /ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ද සහිතව සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා බටහිර සංගීතය ඇතුළු විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සමත්වීම ; හා

4.18.2 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් එකවර සමත්වීම හා
ඉංග්‍රීසි භාෂාව අධි සම්මාන /ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ද සහිතව සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා බටහිර සංගීතය ඇතුළු විෂයයන් 6කින් අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සමත්වීම ; හා

අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනයක බටහිර සංගීතය පිළිබඳව පස්වැනි පන්තිය සමත්වීම (න්‍යායික හා ප්‍රායෝගික).

සැලකිය යුතුයි (i) . බටහිර සංගීත පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී සතුටුදායක කුසලතා මට්ටමකට ලඟා වීම
(ii) මෙම පාඨමාලාවට තෝරාගැනීමේ දී ඉහත 4.18.1 යටතේ සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව දෙනු ලැබේ.

4.19 පාඨමාලා අංකය 19 - නාට්‍ය හා රංග කලාව

4.19.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව ඇතුළුව විෂයයන් 03 කින් සමත්වීම; හා

4.19.2 සංගීතය හෝ නැටුම් හෝ චිත්‍ර, ද ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ද ඇතුළු විෂයයන් 6 කින් අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම.

4.19.3 2005 වසරේ අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

**4.20 පාඨමාලා අංකය 20 - තොරතුරු සන්නිවේදන තාක්ෂණය**

4.20.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් (ශ්‍රී පාද අධ්‍යාපන විද්‍යාපීඨයට විෂයයන් දෙකකින්) එකවර සමත්වීම; හා

4.20.2 අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍ය විෂයයට සහ ගණිතයට සම්මාන සාමාර්ථයන් ද සහිතව සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම.

**4.21 පාඨමාලා අංකය** 21-i. සාමාජීය විද්‍යාව (සිංහල)
21-ii. සාමාජීය විද්‍යාව (දෙමළ)
21-iii. සාමාජීය විද්‍යාව (ඉංග්‍රීසි)

4.21.1 2005 වර්ෂයේදී පවත්වන ලද අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී ඉතිහාසය, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, හා භූගෝල විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව එකවර විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉහත විෂයයන් දෙකකින්) එකවර සාමාර්ථ්‍යය ; හා

4.21.2 සමාජ අධ්‍යයනය හා ඉතිහාසය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත්වීම.

**4.22 පාඨමාලා අංකය 22 - පළමුබස (දෙමළ)**

4.22.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට විෂයයන් දෙකකින්) එකවර සමත්වීම; හා

4.22.2 දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථය සහ ගණිතය ඇතුළු විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත්වීම.

**4.23 පාඨමාලා අංකය 23 -** i.. දෙවන බස (සිංහල)
ii. දෙවන බස (දෙමළ)

4.23.1 (i) දෙවන බස (සිංහල) පාඨමාලාව අයදුම්කරුවන් 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් 3 කින් සමත්වීම; හා

4.23.2 අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී වෛකල්පිත දෙවන බස 64 සිංහල විෂය සමත්වීම; හා

4.23.3 දෙමළ භාෂාව, ගණිතය ඇතුළු විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

4.23.1 (ii) දෙවන බස (දෙමළ) පාඨමාලාව අයදුම්කරුවන් 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී සිංහල භාෂාවට සම්මාන සාමාර්ථ්‍යයක් ඇතුළුව විෂයන් 3 කින් සමත්වීම; හා

4.23.2 අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී වෛකල්පිත දෙවන බස 65 දෙමළ විෂය සමත්වීම; හා

4.23.3 සිංහල භාෂාව, ගණිතය ඇතුළු විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත්වීම.

**4.24. පාඨමාලා අංකය 24 - ප්‍රංශ භාෂාව**

4.24.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ප්‍රංශ භාෂාව, ඇතුළු විෂයයන් තුනකින් එකවර සමත්වීම හා,

අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව අධි සම්මාන /ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හා සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළු විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත්වීම.

5.0 *පාඨමාලා අංකය, පාඨමාලාවේ නම, මාධ්‍ය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය එහි අංකය සහිතව පහතින් දැක්වේ.*

(කරුණාකර මේ වගුව හොඳින් පරීක්ෂා කරන්න. සම්මුඛ පරීක්ෂණ සඳහා එක් එක් පාඨමාලාවට අදාළ පරිගණක ලේඛන සකස් කිරීමේ දී ඔබේ ඉල්ලුම් පත්‍රය පරිගණක ගත කරන්නේ පාඨමාලා අංක අනුවය. නිවැරදි තොරතුරු සටහන් නොකළ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.) ඉල්ලුම් පත්‍රය විභාග දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ පසු කිසිදු සංශෝධනයක් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

i. තීරුව - පාඨමාලා අංකය
ii. තීරුව - පාඨමාලාවේ නම
iii. තීරුව - සිංහල මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ
iv. තීරුව - දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ
v. තීරුව - ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ (ඒ ඒ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අංකය පීඨයේ නම ඉදිරියෙන් වරහන් තුළ දැක්වේ.)

| පාඨමාලා අංකය | පාඨමාලාවේ නම | මාධ්‍ය අනුව පාඨමාලා පැවැත්වෙන විද්‍යාපීඨ සහ ඒවායේ අංක | | |
|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| i | ii | iii | iv | v |
| 01 | ප්‍රාථමික | (1) ඌව | (6) වවුනියා | |
| | | (6) වවුනියා | (7) ශ්‍රීපාද | |
| | | (7) ශ්‍රී පාද | (8) අඩ්ඩාලච්චේන | |
| | | (11) පුලතිසිපුර | (9) මඩකලපුව | |
| | | (13) රුවන්පුර | (14) රුහුණ | |
| | | (14) රුහුණ | (15) යාපනය | |
| | | (17) හාපිටිගම | (16) දර්ගා නගර | |
| | | | | |
| 02 | විද්‍යාව i. ii. iii | (2) නිල්වලා | (6) වවුනියා | (2) නිල්වලා |
| | | (5) සියනෑ | (7) ශ්‍රීපාද | (5) සියනෑ |
| | | (7) ශ්‍රීපාද | (9) මඩකලපුව | (15) යාපනය |
| | | | (8) අඩ්ඩාලච්චේන | |
| | | | | |
| 03 | ගණිතය i, ii, iii | (2) නිල්වලා | (7) ශ්‍රීපාද | (2) නිල්වලා |
| | | (5) සියනෑ | (8) අඩ්ඩාලච්චේන | (5) සියනෑ |
| | | (7) ශ්‍රීපාද | (9) මඩකලපුව | (15) යාපනය |
| | | | | |
| 04 | ශාරීරික අධ්‍යාපනය i, ii, iii | (1) ඌව | (6) වවුනියා | (1) ඌව |
| | | (2) නිල්වලා | (8) අඩ්ඩාලච්චේන | (2) නිල්වලා |
| | | (14) රුහුණ | | |
| | | | | |
| 05 | ආහාර තාක්ෂණය හා ගෘහ ආර්ථික විද්‍යාව | (14)රුහුණ | (6) වවුනියා | |
| | | | (16) දර්ගා නගර | |
| | | | | |
| 06 | ඉංග්‍රීසි | | | (3) මහවැලි |
| | | | | (10) පස්දුන්රට |
| | | | | (15) යාපනය |
| | | | | |
| 07 | බුද්ධ ධර්මය | (4) සාරිපුත්ත | | |
| | | | | |
| 08 | හින්දු ධර්මය | | (6) වවුනියා | |
| | | | | |
| 09 | ඉස්ලාම් ධර්මය | | (8) අඩ්ඩාලච්චේන | |
| | | | | |
| 10 | කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය | (12) වයඹ | (6) වවුනියා | |
| 11 | පුස්තකාල විද්‍යාව සහ තොරතුරු අධ්‍යයනය | | | (3) මහවැලි |
| | | | | (10) පස්දුන්රට |
| | | | | (15) යාපනය |

| පාඨමාලා අංකය | පාඨමාලාවේ නම | මාධ්‍ය අනුව පාඨමාලා පැවැත්වෙන විද්‍යාපීඨ සහ ඒවායේ අංක | | |
|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| i | ii | iii | iv | v |
| 12 | විශේෂ අධ්‍යාපනය | (17) හාපිටිගම | (15) යාපනය | |
| | | | (16) දර්ගා නගර | |
| 13. | කෘෂිකර්මය | (11) පුලතිසිපුර | (6) වවුනියා | |
| 14. | තාක්ෂණ අධ්‍යයනය | (5) සියනෑ | (9) මඩකලපුව | |
| 15. | චිත්‍ර | (12) වයඹ | (8) අඩ්ඩාලච්චේන | |
| | | | (15) යාපනය | |
| 16. | නැටුම් (පෙරදිග) | (12) වයඹ | | |
| | නැටුම් (භරත) | | (7) ශ්‍රීපාද | |
| | | | (15) යාපනය | |
| 17. | සංගීතය (පෙරදිග) | (12) වයඹ | | |
| | සංගීතය (කර්ණාට) | | (7) ශ්‍රීපාද | |
| | | | (15) යාපනය | |
| 18. | බටහිර සංගීතය | | | (3) මහවැලි |
| 19. | නාට්‍ය හා රංගකලාව | (12) වයඹ | (15) යාපනය | |
| 20. | තොරතුරු සංනිවේදන තාක්ෂණය | | | (2) නිල්වලා |
| | | | | (5) සියනෑ |
| | | | | (6) වවුනියා |
| | | | | (7) ශ්‍රීපාද |
| | | | | (8) අඩ්ඩාලච්චේන |
| | | | | (9) මඩකලපුව |
| | | | | (11) පුලතිසිපුර |
| | | | | (12) වයඹ |
| | | | | (13) රුවන්පුර |
| | | | | (14) රුහුණ |
| | | | | (16) දර්ගා නගර |
| 21 | සමාජීය විද්‍යාව | (13) රුවන්පුර | (7) ශ්‍රීපාද | (1) ඌව |
| | | | (9) මඩකලපුව | (13) රුවන්පුර |
| 22 | පළමු බස (දෙමළ) | | (7) ශ්‍රීපාද | |
| | | | (9) මඩකලපුව | |
| | | | (16) දර්ගා නගර් | |
| 23 | දෙවන බස i,. ii, | (14) රුහුණ | (6) වවුනියා | |
| 24 | ප්‍රංශ භාෂාව | | | (10) පස්දුන්රට |

*සැලකිය යුතුයි*

(i) අඩ්ඩාලච්චේන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම්කළ යුත්තේ මුස්ලිම් අයදුම්කරුවන් පමණි.

(ii) දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන දර්ගානගරය ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයට අයදුම් කළ යුත්තේ කාන්තාවන් පමණි.

(iii). භරත නැටුම්, කර්ණාට සංගීතය පළමු බස දෙමළ මාධ්‍යයෙන් පමණක් ද, පෙරදිග නැටුම් සහ පෙරදිග සංගීතය සිංහල මාධ්‍යයෙන් පමණක් ද, බටහිර සංගීතය පුස්තකාල විද්‍යාව හා තොරතුරු අධ්‍යයනය හා තොරතුරු සංනිවේදන තාක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් ද, පැවැත්වේ.

**6.0 2007 වර්ෂය සඳහා ශික්ෂණ ලාභීන් තෝරා ගැනීමේ පටිපාටිය**

6.1 තෝරාගැනීමේ පදනම :

6.1.1 2010 වසරේ පාසල් පද්ධතියේ ගුරු අවශ්‍යතාව පදනම් කරගෙන බඳවා ගන්නා ශික්ෂණ ලාභීන් සංඛ්‍යාව තීරණය කර ඇත.

6.1.2 බඳවා ගැනීමේ මූලික පදනම "Z" ලකුණු කුසලතාව වේ. ශ්‍රී පාද විද්‍යා පීඨය හැර අනෙකුත් සියලුම විද්‍යාපීඨවල පවත්වන පාඨමාලා සඳහා ජාතික මට්ටමෙන් 50% ක් ද, දුෂ්කර මට්ටමෙන් 50% ද තෝරාගනු ලැබේ.

6.1.3 ඉංග්‍රීසි, පුස්තකාල විද්‍යාව සහ තොරතුරු අධ්‍යයනය, විද්‍යාව, ගණිතය, බටහිර සංගීතය, ශාරීරික අධ්‍යාපනය, තොරතුරු සංනිවේදන තාක්ෂණය සහ සාමාජීය විද්‍යාව යන පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට ඉල්ලුම් අයදුම්කරුවන් අ. පො. ස. (සා. පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයය 06 කින් අ. පො. ස. (සා. පෙළ.) විභාගයෙන් සමත්වීම අවශ්‍ය වේ.)

6.1.4 ශාරීරික අධ්‍යාපනය නැටුම් (පෙරදිග)/,නැටුම් (භරත), සංගීතය (පෙරදිග)/, සංගීතය(කර්ණාට), සහ බටහිර සංගීතය පාඨමාලා සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී ශාරීරික යෝග්‍යතාව පිළිබඳව සතුටුදායක කුසලතා මට්ටමකට ළඟා විය යුතුය.

**6.2 දුෂ්කර දිස්ත්‍රික්ක පදනම:**

6.2.1 දුෂ්කර දිස්ත්‍රික්ක සඳහා බඳවාගනු ලබන්නේ අධ්‍යාපන සුදුසුකම් බෙදීයාම අනුව දුෂ්කර යයි සලකනු ලබන දිස්ත්‍රික්ක 17 ට අයත් අයදුම්කරුවන්ගෙනි. එක් එක් දිස්ත්‍රික්කයෙන් ඒ ඒ මාධ්‍යයෙන් අ. පො. ස. (උ. පෙළ.) විභාගයට පෙනී සිටි ශිෂ්‍යගහණයේ සමානුපාතයට සෑම පාඨමාලාවකටම ඒ ඒ දිස්ත්‍රික්කයන්ගෙන් බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

6.2.2 එක් එක් දුෂ්කර දිස්ත්‍රික්කය සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටි අවස්ථාවක දී වෙනත් දුෂ්කර දිස්ත්‍රික්ක වලින් පුරප්පාඩු පුරවනු ලැබේ.

**6.2.3 දුෂ්කර දිස්ත්‍රික්ක සහ අංක**

| | | | | | |
|---|---|---|---|---|---|
| මාතලේ | 04 | මන්නාරම | 12 | පුත්තලම | 18 |
| නුවරඑළිය | 06 | මුලතිව් | 13 | අනුරාධපුරය | 20 |
| හම්බන්තොට | 09 | වවුනියාව | 14 | පොළොන්නරුව | 21 |
| යාපනය | 10 | ත්‍රිකුණාමලය | 15 | බදුල්ල | 22 |
| කිලිනොච්චිය | 11 | මඩකලපුව | 16 | මොණරාගල | 23 |
| | | අම්පාර | 17 | රත්නපුර | 25 |

6.2.4 දිස්ත්‍රික්ක නිර්ණය කිරීම

6.2.4.1 යම් පාසල් අපේක්ෂකයකුගේ දිස්ත්‍රික්කය වන්නේ පළමුවරට අ. පො. ස. (උ. පෙළ.) විභාගයට පෙනී සිටි මාසයට පෙරාතුව වූ මාසය දක්වා වූ වසර 5 තුළ සම්පූර්ණ කාලය හෝ වැඩිම කාලයක් (අවුරුදු 2 1/2 කට වැඩි) ඔහු/ඇය ඉගෙනීම කළ පාසල/පාසල් පිහිටා ඇති දිස්ත්‍රික්කයයි.

6.2.4.2 යම් පෞද්ගලික අපේක්ෂකයෙකු ඊට ප්‍රථමයෙන් පාසල් අපේක්ෂකයකු වශයෙන් පළමුවරට අ. පො. ස. (උ. පෙළ.) විභාගයට පෙනී සිට පාසල හැර ගොස් ඇති අවස්ථාවක එකී අපේක්ෂකයාගේ දිස්ත්‍රික්කය වන්නේ ප්‍රථමයෙන් එකී විභාගයට පෙනී සිටි පාසල පිහිටි දිස්ත්‍රික්කයයි.

6.2.4.3 යම් පෞද්ගලික අපේක්ෂකයෙකු යම් හෙයකින් පාසල් අපේක්ෂකයෙකු වශයෙන් අ. පො. ස. (උ. පෙළ.) විභාගයට කලින් පෙනී නොසිට පාසල් හැරගොස් ඇති අවස්ථාවක එකී අපේක්ෂකයාගේ දිස්ත්‍රික්කය වනනේ අ. පො. ස. (උ. පෙළ.) විභාගයට පළමුවරට පෙනීසිටි මාසයට පෙරාතුවම වූ මාසයේ අවසාන දිනය දක්වා ඇති වර්ෂ පහ තුළ වැඩිම කාලයක් (අවුරුදු 2 1/2 කට වැඩි) අධ්‍යාපනය ලැබූ පාසල හෝ පාසල් පිහිටා ඇති දිස්ත්‍රික්කයයි.

6.2.4.4 පාසලක අධ්‍යාපනය නොලැබූ පෞද්ගලික අපේක්ෂකයෙකු නම් ග්‍රාම සේවා නිලධාරි හා ප්‍රාදේශීය ලේකම් ගේ දිවුරුම් ප්‍රකාශයක් හෝ මැතිවරණ දෙපාර්තමේන්තුවේ ඡන්ද හිමි නාම ලේඛනය මගින් පමණක් ඉහත දිස්ත්‍රික්කයක පදිංචිය තහවුරු කළ යුතුය.

6.3 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට තෝරා ගැනීම

6.3.1 පුරප්පාඩු සංඛ්‍යාවෙන් 75% ක් ඉන්දියානු උද්භව සම්භවය ඇති අයදුම්කරුවන්ගෙන් ද, 25% ක් සිංහල අයදුම්කරුවන්ගෙන් ද පුරවනු ලැබේ.

6.3.2 දෙමළ මාධ්‍යය පාඨමාලා සඳහා 75% ක් ද, සිංහල මාධ්‍යය පාඨමාලා සඳහා 25% ක් ද තෝරාගනු ලැබේ.

6.3.3 ප්‍රාථමික, ගණිතය, විද්‍යාව, යන පාඨමාලා සිංහල මාධ්‍යයෙන් ද ප්‍රාථමික, ගණිතය, විද්‍යාව, කර්ණාට සංගීතය, භරත නැටුම්, හා පළමු බස (දෙමළ) සාමාජීය විද්‍යාව යන පාඨමාලා දෙමළ මාධ්‍යයෙන් ද, තොරතුරු සංනිවේදන තාක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද පැවැත්වේ.

6.3.4 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම් කළ යුත්තේ නුවරඑළිය, මහනුවර, මාතලේ, බදුල්ල, රත්නපුරය, කෑගල්ල, කළුතර, මාතර ගාල්ල සහ කුරුණෑගල යන වැවිලි දිස්ත්‍රික්කවල පදිංචිය අය ගේ දරුවන් පමණි.

6.3.5 තෝරාගැනීමේ දී ඉහත සඳහන් වැවිලි දිස්ත්‍රික්ක දහයෙහි වතු අංශයෙහි පදිංචි වතු සේවකයන්ගේ දරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ. රාජ්‍ය හා ලියාපදිංචි පෞද්ගලික වතු සමාගම්වල සේවකයන්ගේ දරුවන් ඒ බව තහවුරු කිරීම සඳහා වතු අධිකාරීගේ ලිපිය (සේවකයා සේවය කළ දින වකවානු සහිතව) හා සේවක අර්ථසාධක අරමුදලට අයකිරීම් කරන බව ලියාපදිංචි අංක සහිතව ඔප්පු කරන ලිපි සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම්කරුගේ දිස්ත්‍රික්කය නිර්නය කිරීමේ පදනම දැක්වෙන 6.2.2 ඡේදය ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම්කරුවන් තෝරාගැනීමේදී ද අදාළ කරගනු ලැබේ.

6.3.6 අදාළ සෑම දිස්ත්‍රික්කයකින්ම අවම වශයෙන් එක් අයදුම්කරුවෙකුවත් තෝරාගැනීම සඳහා සලකා බලනු ලැබේ.

*සැලකිය යුතුයි*:- සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ ඉන්දියානු සම්භවය ඇති අයදුම්කරුවකු නම් ඉන්දියානු සම්භවයට හිමි ප්‍රතිශතය සඳහා සලකා බලනු ලැබේ. එමෙන් ම දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහල අයදුම්කරුවකු නම් සිංහල මාධ්‍ය ප්‍රතිශතය සඳහා සලකා බලනු ලැබේ.

7.0 තෝරාගැනීමට අදාළ වෙනත් කරුණු

7.1 තෝරාගනු ලබන අයදුම්කරුවන් අදාළ පාඨමාලාව සඳහා යෝග්‍යතාව සනාථ කිරීමට පිළිගත හැකි ලිඛිත සාක්ෂි සහ සහතිකවල මුලික පිටපත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

7.2 සියලුම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණ දිනට ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් තෝරාගනු නොලැබේ.

7.3 පාඨමාලාවේ අපේක්ෂිත මට්ටමට ළඟා වීමට අයදුම්කරුවන් වෙත තිබිය යුතු කායික මානසික යෝග්‍යතාව පිළිබඳ ගැටළු තත්ත්වයන් නිරීක්ෂණය වූ අවස්ථාවක එකී තත්ත්වයන් පිළිබඳ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමකට පත් නොවේ නම් විශේෂ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක පරීක්ෂණයකට භාජනය කොට එහි වාර්තාව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයට ඉදිරිපත් කර ලබාගන්නා තීරණය ක්‍රියාත්මක කරනු ඇත.

7.4 තෝරාගනු ලබන අයදුම්කරුවන් අදාළ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ ලියාපදිංචි වීමට නියමිත දිනයේ සිට දින 03 ක් ඇතුළත ලියාපදිංචි නොවුවහොත් ඇතුළත්වීමේ අවස්ථාව ඔහුට/ඇයට අහිමි වනු ඇත. මේ අනුව ඇති වන පුරප්පාඩු කුසලතා අනුපිළිවෙලට පුරවනු ලැබේ.ඉල්ලුම් කරනු ලබන විද්‍යා පීඨයේ පුරප්පාඩු නොමැති විටක අදාළ පාඨමාලාව පැවැත්වෙන පුරප්පාඩු ඇති වෙනත් විද්‍යාපීඨයකට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

7.5 තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මානසික හා කායික සෞඛ්‍යයෙන් යුක්ත දැයි පරීක්ෂාකර බැලීම සඳහා විද්‍යාපීඨවලට ඇතුළත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

7.6 යම් පාඨමාලාවකට/ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයකට තෝරාගත් පසු ඒ පාඨමාලාව/ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. කිසියම් පාඨමාලාවකට ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොපැමිණි අවස්ථාවක ළඟම ඇති විද්‍යා පීඨයකට අදාල පාඨමාලාව හැදෑරීමට මාරු කරනු ලැබේ.

7.7 යම්කිසි පාඨමාලාවක් සඳහා තෝරාගැනීමේ දී අ. පො. ස. (උ. පෙළ.) විභාගයේ දී යම්කිසි එකම ලකුණක් ලබාගෙන ඇති අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව තවදුරටත් තෝරා ගත යුතු පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි නම්, අදාළ අයදුම්කරුවන්ගේ පළමු වරට අ. පො. ස. (සා. පෙළ.) විභාගයට ඉදිරිපත් වූ ප්‍රතිඵල සැලකිල්ලට භාජනය කෙරේ. විශිෂ්ඨ සාමාර්ථයකට ලකුණු 03 ක් ද, සම්මාන සාමාර්ථයකට ලකුණු 2 ක් ද, සාමාන්‍ය සාමාර්ථයකට ලකුණු 01 ක් ද, බැගින් ලකුණු ප්‍රදානය කොට සමස්ත ලකුණු සංඛ්‍යාව පදනම් කර ගනිමින් නියමිත පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ. මෙම ලකුණු දීම ප්‍රධාන විෂයයන් අටකට පමණක් සීමා කෙරේ.

8.0 *පාඨමාලා සඳහා අයදුම් කිරීමට හෝ ඇතුළත් වීමට නුසුදුස්සන්* :

8.1 දැනටමත් රජයේ හෝ පෞද්ගලික හෝ පාසැල්වල ගුරු පත්වීම් ලබා ඇති අය,

8.2 රජයේ පාසලක පත්වීමක් සඳහා තෝරා ගනු ලැබ සිටින අය,

8.3 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක පාඨමාලාවක් හදාරන හෝ හැදෑරූ අය,

8.4 විශ්ව විද්‍යාලයක/විශ්ව විද්‍යාල විද්‍යායතනයක/වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක/අ. පො. ස. (උ. පෙළ) සුදුසුකම් වලින් බඳවා ගන්නා පාඨමාලාවක ලියාපදිංචි/හදාරමින් සිටින හෝ උපාධි පාඨමාලාවක් හදාරා අවසන් කළ අය, (අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයට පසුව විශ්ව විද්‍යාලවල ලියාපදිංචිය අවලංගු කරගෙන සම්මුඛ පරීක්ෂණ සඳහා පැමිණෙන අය තෝරාගැනීම සඳහා සුදුසුකම් නොලබන බව අවධාරණය කෙරේ.)

8.5 විනයානුකූල හේතූන් මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකින් ඉවත් කරනු ලැබූ අය.

9.0 *පුහුණුව හා අදාල කොන්දේසි* :

9.1 පුහුණු පාඨමාලාවක කාල සීමාව අවුරුදු තුනකි. එය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අවුරුදු දෙකක නේවාසික ආයතනික පුහුණුවකින් ද, පාසලකට අනුයුක්තව සිදු කෙරෙන වසරක සීමාවාසී පුහුණුවකින් ද සමන්විත වේ. දෙවන වසර අවසානයේ දී විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන බාහිර අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ශික්ෂණලාභියාගේ පැමිණීම 90% කට නොඅඩු විය යුතුය.

9.2 සෑම ශික්ෂණලාභියකු ම පළමු වසර අවසානයේ සහ දෙවන වසර අවසානයේ පවත්වනු ලබන අභ්‍යන්තර පරීක්ෂණයෙන් ද ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන අවසාන බාහිර විභාගයෙන් ද සමත් විය යුතුයි. එමෙන් ම ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාව හදාරන අය හැර අනෙක් සියලුම පාඨමාලා හදාරන අය ඉහත විභාගවලදී ඉංග්‍රීසි විෂයයෙන් සමත් විය යුතුය. ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ එම කොන්දේසි වලට එකඟ වන අය පමණි.

9.3 ශික්ෂණලාභියෙකුට නේවාසික පුහුණුව ලබන වර්ෂ දෙක තුළ දී වර්ෂයකට මාස 10 ක් සඳහා මාසයකට රු. 1,500 ක වටිනාකමින් යුත් ආහාරපාන හා නේවාසික පහසුකම් සපයනු ලැබේ. සීමාවාසී වර්ෂය තුළ දී මාස 10 ක් සඳහා මාසයකට රු. 2,000 බැගින් යුත් දීමනාවක් ගෙවනු ලැබේ. පෞද්ගලික අවශ්‍යතාවලට අදාල සෙසු වියදම් ශික්ෂණලාභියා විසින් දැරිය යුතුය.

9.4 පුහුණු වන කාල සීමාව තුළ ශික්ෂණලාභියා විශ්ව විද්‍යාලයක, විශ්ව විද්‍යාල විද්‍යායතනයක, වෙනත් ආයතනයක, උසස් පෙළ සුදුසුකම් වලින් බඳවා ගන්නා පාඨමාලාවක, අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට කිසිසේත් අවසර දෙනු නොලැබේ. එසේ පාඨමාලාවක නිරතවන බව සනාථ වුවහොත් ශික්ෂණලාභියා වෙනුවෙන් දරන ලද වියදම ආපසු අයකරගෙන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

9.5 පුහුණුවන කාල සීමාව තුළ දී අභ්‍යාසලාභියකු විවාහවුවහොත් ශිෂ්‍ය භාවය අවලංගු කරනු ලැබේ. භික්ෂූන් වහන්සේලා ලියාපදිංචි වීමෙන් පසු උපැවිදි වුවහොත් පාඨමාලාවෙන් ඉවත්කරනු ලැබේ. පුහුණුව අවසන් කළ පසු සෑම ආගමකටම අයත් පූජ්‍ය පක්ෂය උපැවි දි නොවී අවම වශයෙන් අවුරුදු පහක් අධ්‍යාපන අමාත්‍යාංශයට සේවය කරන බවට අමාත්‍යාංශය සමග ගිවිසුමකට එළඹිය යුතුයි.

9.6 පුහුණුවන කාලසීමාව තුළ අපේක්ෂිත හැසිරීම, උද්‍යෝගය හා අධ්‍යයන කටයුතුවල ප්‍රගතිය නොපෙන්වන ශික්ෂණලාභියෙකු පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ. එසේම ශාස්ත්‍රීය පුහුණුවේ ප්‍රථම වර්ෂය තුළ දී කරනු ලබන ඇගැයීමේදී සතුටුදායක මට්ටමකට එළැඹීමට අසමත් හෝ 9.4 ඡේදයේ දැක්වෙන පාඨමාලාවක් හදාරන බව සනාථ වුවහොත්, පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ. මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වනු ඇත.

9.7 පුහුණුවන කාල සීමාව තුළ දී ශික්ෂණලාභියා ගේ කායික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් පීඨාධිපතිගෙන් හෝ සීමාවාසී කාල සීමාව තුළ විදුහල්පතිගෙන් පැමිණිලි ලැබේ නම් නැවත විශේෂ සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් කරනු ලැබේ. එහි වාර්තාව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයට ඉදිරිපත්කර අවසාන තීරණය ගනු ලැබේ.

9.8 පුහුණුව සඳහා නියමිත අවුරුදු තුනේ කාල සීමාව සම්පූර්ණ කිරීමට පෙර පුහුණුව අත්හරින්නේ නම් පුහුණු කිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට වැය වූ මුදල ආපසු අමාත්‍යාංශයට ගෙවන බවට ශික්ෂණලාභීන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශය සමග ගිවිසුමකට ඇතුළත් විය යුතු වේ.

9.9 පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන ශික්ෂණලාභීන්ට ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ. පාඨමාලාශ්‍රිත වැඩ හා පෞරුෂ වර්ධනය (අනිවාර්යයෙන්ම සහභාගි විය යුතු විෂයය සමගාමී කටයුතු ඇතුළු) පුහුණුවීම් කාලය තුළ දී අඛණ්ඩ ලෙස අගයනු ලබන අතර, මේ ඇගයීම් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කිරීම සඳහා කරනු ලබන අවසාන ඇගයීමේ කොටසක් වනු ඇත.

9.10 රජයේ පාසල්වල ඇතිවන ඇබෑර්තු සංඛ්‍යාව පදනම් කරගෙන මෙම පාඨමාලාවන් සාර්ථක ලෙස සම්පූර්ණ කරන අයදුම්කරුවන්ට ගුරු පත්වීම් ලබාදීම සඳහා සළකා බලනු ලැබේ. අනාගතයේ දී රජයේ පාසල්වලට ගුරු පත්වීම් දීමේ දී මෙම පුහුණු පාඨමාලා සම්පූර්ණ කළ අයට ප්‍රමුඛත්වය ලැබෙනු ඇත. පුස්තකාල විද්‍යාව හා තොරතුරු අධ්‍යයන පාඨමාලාව සම්පූර්ණ කරන ශික්ෂණලාභීහු ගුරු පුස්තකාලයාධිපති

තනතුරු සඳහා රජයේ පාසල්වල පත්වීම් ලැබීමට සුදුසුකම් ලබති. රජයේ පාසැල්වලට පත් කරනු ලබන අය, පත්වීම් දින සිට පස් අවුරුද්දක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන බවට අධ්‍යාපන අමාත්‍යාංශය සමග ගිවිසුමකට බැඳිය යුතුය.

9.11 පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන, එහෙත් රජයේ ගුරුවරුන් වශයෙන් රැකියාව භාර නොගන්නා අය පුහුණුවට වැය වූ මුදල අධ්‍යාපන අමාත්‍යාංශයට ආපසු ගෙවිය යුතුය. ඒ සම්බන්ධව ද ගිවිසුමකට බැඳිය යුතුය.

9.12 සියලුම අධ්‍යාපන හා සෙසු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනයට සම්පූර්ණ කොට තිබිය යුතුය.

10.0 *අයදුම් කිරීම* :

10.1 එක් අයදුම්කරුවකුට උපරිම වශයෙන් පාඨමාලා තුනකට අයදුම් කළ හැකිය. එකම පාඨමාලාවකට මාධ්‍ය දෙකකින් අයදුම් කළහොත් එය ද පාඨමාලා දෙකකට අයදුම් කළාසේ සැළකේ. එවැනි අයදුම්කරුවකුට තවත් එක් පාඨමාලාවකට පමණක් අයදුම් කළ හැකිය. උදා. විද්‍යාව පාඨමාලාව සිංහල මාධ්‍ය සහ විද්‍යාව පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍ය යන දෙකටම අයදුම් කළ අයදුම්කරුවකුට අයදුම්කළ හැක්කේ තවත් එක් පාඨමාලාවකට පමණකි.

10.2 එක් අයදුම්කරුවෙකු විසින් එක් අයදුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතුය. එකකට වඩා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇත්නම් සියලුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.3 අයදුම්පත්‍රය පහත දැක්වෙන උපදෙස් හා ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කළ යුතුය.

10.4 අයදුම්පත්‍ර 2006 ජුනි 26 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, පාසල් විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව, තැ. පෙ. 1503 කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම් පත්‍රය බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ ;

2007 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත්වීම සඳහා අයදුම්පත්‍රය,
පළමු මනාපය ලෙස දක්වා ඇති පාඨමාලාව සහ අංකය ...........

යන කරුණු පිළිබඳ තොරතුරු පැහැදිලි ලෙස ලිවිය යුතුය. (අධ්‍යාපන අමාත්‍යාංශයට හෝ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට හෝ අයදුම් පත්‍ර නොඑවිය යුතු බව අවධාරණය කරමි.)

10.5 විද්‍යාපීඨ බඳවා ගැනීම සම්බන්ධයෙන් විමසීමක් හෝ අභියාචනයක් ඉදිරිපත් කරන සෑම අවස්ථාවක දී ම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ ලියාපදිංචි තැපැල් කුවිතාන්සිය සහ ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එමනිසා ඒවා අයදුම්කරු ළඟ තබා ගත යුතුය.

10.6 විභාග අංකය, වර්ෂය, පාඨමාලා අංකය සහ පාඨමාලාව නිවැරදිව ඇතුළත් නොකරන ලද හා අසම්පූර්ණ අවිධිමත් අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.7 අයදුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

10.8 අයදුම්පත්‍රයට වෙනත් කිසිදු ලියවිල්ලක් අමුණා නොඑවිය යුතුය.

10.9 අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන සහතිකයක් කූට හෝ වංචනික හෝ සහතිකයක් බවට පසුව හෙළි වුවහොත් අයදුම්කරු සේවයෙන් පහ කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ කිසිම පත්වීමක් සඳහා නුසුදුස්සෙකු වනු ඇත.

11.0 *ගැසට් නිවේදනයේ* ඉහත සඳහන් තොරතුරු මත මතුවන ගැටළු පිළිබඳව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

12.0 මෙම *ගැසට් නිවේදනයෙහි* සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨමාලා අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වේ.

ආරියරත්න හේවගේ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2006 මැයි මස 05 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

### අයදුම්පත් පිළියෙල කිරීම සඳහා උපදෙස්

ගැසට් නිවේදනය කීපවරක් සැලකිල්ලෙන් කියවන්න. ඔබට සුදුසුකම් ඇති පාඨමාලා තුනකට එක් අයදුම් පත්‍රයක පමණක් අයදුම් කරන්න. මෙම අයදුම්පත්‍රය හා එහි සහතික කළ ඡායා පිටපත් දෙකක් පමණක් එකම කවරයක බහා ඉදිරිපත් කරන්න. පහත දැක්වෙන ආදර්ශය අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙන්ටි මීටර් 21 X සෙන්ටිමීටර් 29.7) සුදු කඩදාසියක අයදුම්පත පිළියෙල කරන්න. 1.0 - 10.2 දක්වා ඡේද පළමුවන පිටුවට ඇතුළත් වන සේ සකස් කරන්න. කොටුවක් තුළ තොරතුරු දැක්විය යුතු අවස්ථාවල දී අදාළ කොටුව තුළ "X" ලකුණ යොදන්න.

අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා එක් එක් පාඨමාලාව වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුව පිළියෙල කරන පරිගණක නාමාවලි සකස් කරන්නේ පළමු පිටුවේ දැක්වෙන 1.0 - 10.3 දක්වා තොරතුරු පදනම් කරගෙන බව කරුණාවෙන් සලකන්න. විශේෂයෙන්ම පාඨමාලාවේ අංකය පාඨමාලාව අ. පො. ස. (උ. පෙළ.) විභාගයේ අංකය, Z අගය නිවැරදි බවට තහවුරු කරගන්න. අංක එක උඩ එක ලිවීමෙන් හෝ නොපැහැදිළිව ලිවීමෙන්, වැරදි ලෙස ලිවීමෙන් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න.

ශාරීරික අධ්‍යාපන පාඨමාලාව සඳහා ඉල්ලුම් පත්‍රයේ 13.0 ඡේදය ද, බුද්ධ ධර්මය පාඨමාලාව සඳහා ඉල්ලුම් පත්‍රයේ 14.0 ඡේදය ද, කතෝලික/ ක්‍රිස්තියානි ධර්මය සඳහා 15.0 ඡේදය ද, හින්දු ධර්මය/ඉස්ලාම් ධර්මය සඳහා 16.0 ඡේදයේ ද, තාක්ෂණ අධ්‍යයනය සඳහා 17.0 ඡේදය ද, බටහිර සංගීතය සඳහා 18.0 ඡේදය ද දක්වා ඇති තොරතුරු සැලකිල්ලට ගැනේ. ඒ නිසා ඒවා නිවැරදිව පිරවිය යුතුයි. ඒවා පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට නියමිත අංක හා පාඨමාලාවට නියමිත අංක මෙම *ගැසට් නිවේදනයේ* 5.0 ඡේදයේ දැක්වේ.

දිස්ත්‍රික්කවලට නියමිත අංක මෙසේ ය:

| | | | | | |
|---|---|---|---|---|---|
| කොළඹ | 01 | හම්බන්තොට | 09 | අම්පාර | 17 |
| ගම්පහ | 02 | යාපනය | 10 | පුත්තලම | 18 |
| කළුතර | 03 | කිලිනොච්චිය | 11 | කුරුණෑගල | 19 |
| මාතලේ | 04 | මන්නාරම | 12 | අනුරාධපුරය | 20 |
| මහනුවර | 05 | මුලතිවු | 13 | පොළොන්නරුව | 21 |
| නුවරඑළිය | 06 | වවුනියාව | 14 | බදුල්ල | 22 |
| ගාල්ල | 07 | ත්‍රිකුණාමලය | 15 | මොණරාගල | 23 |
| මාතර | 08 | මඩකලපුව | 16 | කෑගල්ල | 24 |
| | | | | රත්නපුර | 25 |

මාධ්‍ය : සිංහල - S දෙමළ- T ඉංග්‍රීසි - E

### ආදර්ශ අයදුම්පත්‍රය

*ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම - 2007*

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

(අයදුම්කරුවකු එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කළ යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන ලෙස සකස් කළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ 10 වෙනි ඡේදය දක්වා තොරතුරු පළමු පිටුවට ඇතුළත් කරන්න. තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා පරිගණක නාමාවලිය සකස් කරන්නේ 1.0 - 10.3 දක්වා තොරතුරු ඇසුරෙනි.)

1.0

| *මනාපය* | *පාඨමාලාවේ අංකය* | *පාඨමාලාවේ නම* | *ජා. අ. වි. පීඨයේ අංකය* | *ජා. අ. වි. පීඨයේ නම* | *මාධ්‍යය* | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | *S* | *T* | *E* |
| 1. | | | | | | | |
| 2. | | | | | | | |
| 3. | | | | | | | |

2.0 2.1 මුල'කුරු සමග නම ඉංග්‍රීසියෙන් Rev./Mr./Miss.:____________,
නිදසුන (In Block Letters) Mr. Perera R. C.

2.2 සම්පූර්ණ නම : සිංහලෙන්/දෙමළෙන් :____________,

3.0 ස්ථිර පදිංචි ලිපිනය :

3.1 ඉංග්‍රීසියෙන් :____________,

3.2 සිංහලෙන්/දෙමළෙන් :____________,

3.3 තැපැල් කාර්යාලයේ සංකේත අංකය :____________,

4.0 ස්ථිර පදිංචි පරිපාලන දිස්ත්‍රික්කය හා අංකය :____________,

5.0 *ගැසට් නිවේදනයේ* 6.2 ඡේදයේ අදාල වේ නම් පමණක් 6.2.4 ඡේදය අනුව දිස්ත්‍රික්කය හා අංකය:____________,

6.0 6.1 උපන් දිනය : (ඉලක්කමෙන්) අවුරුද්ද: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

6.2 2006.01.01 දිනට වයස: අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

6.3 ජාතික හැඳුනුම්පත් අංකය: ☐☐☐☐☐☐☐☐☐☐

7.0 ස්ත්‍රී/පුරුෂ භාවය: 0 පුරුෂ ☐ 1 ස්ත්‍රී ☐

8.0 ජන වර්ගය:

| සිංහල | ශ්‍රී ලංකා ද්‍රවිඩ | ඉන්දියානු ද්‍රවිඩ | මුස්ලිම් | වෙනත් |
|---|---|---|---|---|
| ☐ | ☐ | ☐ | ☐ | ☐ |
| 1 | 2 | 3 | 4 | 5 |

9.0 2005 වර්ෂයේ අ. පො. ස. (උ. පෙළ.) විභාගයේ ප්‍රතිඵල:

9.1 වර්ෂය : ☐☐☐☐

9.2 විභාග අංකය: ☐☐☐☐☐☐☐

9.3 Z අගය : ☐ ☐☐☐☐

9.4 ප්‍රතිඵල විස්තර:

| | *විෂයය* | *ලැබූ ශ්‍රේණිය* |
|---|---|---|
| 1. | ____________ | ____________ |
| 2. | ____________ | ____________ |
| 3. | ____________ | ____________ |
| 4. | ____________ | ____________ |

10.0 10.1 ඉංග්‍රීසි සහ ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාවල අයදුම්කරුවන් අ. පො. ස. (සා. පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට ලැබූ ඉහළම ශ්‍රේණිය: ☐

වර්ෂය : ☐☐☐☐ විභාග අංකය: ☐☐☐☐☐☐☐

10.2 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම් කරන අය තමන් වතු සේවක දරුවෙක්ද යන්න අදාල කොටුවේ "X" ලකුණින් දැක්විය යුතුයි. 1. ඔව් ☐ 2. නැත ☐

10.3 ශාරීරික අධ්‍යාපනය සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යය අයදුම්කරුවන් තම අයදුම්පතෙහි 13.0 වගන්තිය සඳහා ඇතුළත් කරනු ලබන ලකුණුවල එකතුව (4.4.3. හා 4..4.4ට අනුව) ☐

11.0 2005 වර්ෂයට පෙර ඔබ අ. පො. ස. (උ. පෙළ.) විභාගයට පෙනී සිට ඇත්නම් ඔබ පෙනී සිටියේ එක් විෂයයකට පමණක් වුව ද එක් එක් වාරයේ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න:

| | | 1 | 2 |
|---|---|---|---|
| 11.1 | විභාගයට පෙනී සිටි වාර: | ____________ | ____________ |
| 11.2 | වර්ෂය : | ____________ | ____________ |
| 11.3 | විභාග අංකය: | ____________ | ____________ |
| 11.4 | විභාග මධ්‍යස්ථානයේ අංකය: | ____________ | ____________ |
| 11.5 | ලැබූ ඒකාබද්ධ ලකුණු/ Z අගය: | ____________ | ____________ |

11.6 සමත් වූ විෂයයන් හා ශ්‍රේණි :

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

12.0 සමත් වූ අ. පො. ස. (සා. පෙ.) විභාගය පිළිබඳ විස්තර:

| | | 1 | 2 | 3 |
|---|---|---|---|---|
| 12.1 | විභාගයට පෙනී සිටි වාර: | | | |
| 12.2 | වර්ෂය: | | | |
| 12.3 | විභාග අංකය : | | | |
| 12.4 | විභාග මධ්‍යස්ථානයේ අංකය: | . | | |
| 12.5 | සමත් වූ විෂයයන් හා ශ්‍රේණි: | | | |

| | *විෂය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|---|
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |
| 5. | | | | | | |
| 6. | | | | | | |
| 7. | | | | | | |
| 8. | | | | | | |

13.0 ගැසට් නිවේදනයේ 4.4 ඡේදයේ 4.4.3 හා 4.4.4 වගන්තියට අනුව ක්‍රීඩා ප්‍රවීණතාව පිළිබඳ විස්තර. (ශාරීරික අධ්‍යාපන පාඨමාලාවට අයදුම් කරන අය පමණක් පිරවිය යුතුය.) මෙම කොටස සම්පූර්ණ කිරීමේ දී 4.4.3 හි සියලු වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කළ යුතුය. ඔබ ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික/නිපුණතා තුනක තොරතුරු පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. ඔබ අ. පො. ස (සා. පෙළ) විභාගයේ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයයට පෙනී සිට සාමාර්ථ ලබා ඇත්නම් 4.4.4 ට අනුව ශ්‍රේණියට හිමි ලකුණු ද පහත කොටසෙහි සඳහන් කළ යුතුය. මුලු ලකුණුවල එකතුව මුල් පිටුවේ 10.3 හි ද ඇතුළත් කළ යුතුය.

### ක්‍රීඩා ප්‍රවීණතාව

| *අනු අංකය* | *වර්ෂය* | *නිකුත් කළ අමාත්‍යාංශය/ ආයතනය/සංගමය* | *තරඟ නියෝජනය කළ මට්ටම අන්තර්ජාතික/ජාතික/ පළාත්/දිස්ත්‍රික්ක කලාප* | *ඉසව්ව/ක්‍රීඩාව* | *ලැබූ ස්ථානය* | *4.4.3 ට අදාල ලකුණු* |
|---|---|---|---|---|---|---|
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| අ. පො. ස. (සා. පෙළ) සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයයට (පෙනී සිටියේ නම්) ලද ශ්‍රේණිය | | | | | ලකුණු | |
| | | | | | මුළු එකතුව | |

14.0 *ගැසට් නිවේදනයේ* 4.7 වගන්තියේ (අ) අනුව ප්‍රාචීන ප්‍රාරම්භ, බෞද්ධ ධර්මාචාර්ය පිරිවෙන් අවසාන විභාග ප්‍රතිඵල පිළිබඳ විස්තර ඇත්නම් ඇතුළත් කරන්න.

| විභාගය | ප්‍රාචීන ප්‍රාරම්භ | බෞද්ධ ධර්මාචාර්ය | පිරිවෙන් අවසාන | දහම් පාසල් අවසාන |
|---|---|---|---|---|
| 14.1 වර්ෂය | | | | |
| 14.2 විභාග අංකය | | | | |
| 14.3 මධ්‍යස්ථාන අංකය | | | | |
| 14.4 විෂය හා ශ්‍රේණිය | 1.<br>2.<br>3.<br>4. | 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6. | 1.<br>2<br>3.<br>4.<br>5.<br>6.<br>7.<br>8.<br>9.<br>10.<br>11. | |

15.0 ගැසට් නිවේදනයේ 4.10 ජේදය අනුව කතෝලික/ක්‍රිස්තියානි ධර්මය, අයදුම්කරුවන් විසින් අදාල කොටස පිරවිය යුතුය.

| පාඨමාලාවේ නම/සහතිකය | හදාරන ලද කාලය | | |
|---|---|---|---|
| | සිට | දක්වා | ලබා ඇති සාමාර්ථය |
| 15.1 දේව ධර්මය පිළිබඳ පාඨමාලාව BTH | | | |
| 15.2 ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන කතෝලික දහම් ගුරු සහතිකය | | | |
| 15.3 දේව ධර්ම නිකේතනය මගින් පවත්වනු ලබන කතෝලික ධර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය | | | |
| 15.4 රදගුරු පදවි මට්ටමෙන් පවත්වනු ලබන කතෝලික දහම් සහතිකය | | | |
| 15.5 පිළිමතලාව ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලය මගින් පවත්වනු ලබන දේව ධර්මවේදී ඩිප්ලෝමා සහතිකය | | | |
| 15.6 ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය මගින් පිරිනමනු ලබන ආගමික දැනුම පිළිබඳ ජාතික ධර්මාචාර්ය සහතිකය | | | |

16.0 *ගැසට් නිවේදනයේ* 4.8 සහ 4.9 සඳහා හින්දු ධර්මය/ඉස්ලාම් ධර්මය, අයදුම්කරුවන් විසින් අදාළ කොටස සම්පූර්ණ කළ යුතුයි.

| පාඨමාලාවේ නම | කාලසීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

17.0 *ගැසට් නිවේදනයේ* 4.14 ඡේදයේ තාක්ෂණ අධ්‍යයනය පාඨමාලාවට අනුව ඇතුළත් වීමට අපේක්ෂිත අයදුම්කරුවන් රජයේ පිළිගත් ආයතනයකින් ශිල්පීය පාඨමාලාවක් හදාරා නිමකොට තිබේ නම් පහත සඳහන් කොටස සම්පූර්ණ කළ යුතුයි.

| *ශිල්පීය පාඨමාලාවේ නම* | *රජයේ ලියාපදිංචි අංකය හා වලංගු දිනය* | *පවත්වන ලද ආයතනය* | *කාල සීමාව* | *පාඨමාලාව සාර්ථක ලෙස නිමකර තිබේ ද?* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

18.0 *ගැසට් නිවේදනයේ* 4.18.1, 4.18.2 ජේද අනුව බටහිර සංගීතය පාඨමාලාව ඉල්ලුම්කරුවන් අදාළ තොරතුරු ඇතුළත් කළ යුතුය.

පාඨමාලාව .........................
බටහිර සංගීතය පිළිබඳ නිපුණතාවය

| *අනු අංකය* | *වර්ෂය* | *සහතිකය නිකුත් කළ ආයතනය* | *ප්‍රවීණතාව/සමත් පංතිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

19.0 *අයදුම්කරුගේ ප්‍රකාශය* .–

(i) මා විසින් ඉදිරිපත් කර ඇත්තේ එක් අයදුම් පත්‍රයක් පමණි. එක් ඉල්ලුම් පත්‍රයකට වඩා ඉදිරිපත් කළ විට මාගේ සියලුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප වන බව මම දනිමි. ඉල්ලුම් කරනු ලබන විද්‍යා පීඨයේ පුරප්පාඩු නොමැති විටක අදාල පාඨමාලාව පැවැත්වෙන පුරප්පාඩු ඇති වෙනත් විද්‍යාපීඨයකට ඇතුළත් වීමට කැමැත්ත ප්‍රකාශ කරමි.

(ii) මා විසින් අයදුම්පතේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. ම විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි බව හෙළි වුවහොත් මා තෝරා ගැනීමට නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව අසත්‍ය හෝ වැරදි බව හෙළි වුවහොත් මාගේ තෝරා ගැනීම අවලංගු වන බවත් මම දනිමි.

(iii) මා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම්කර නොමැති බවත්, විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබාගෙන නොමැති බවත්, විශ්වවිද්‍යාලයක/විශ්වවිද්‍යාල විද්‍යායතනයක/වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක ලියාපදිංචි වී නොමැති බවත්/පාඨමාලාවක් හදාරමින් නොසිටින බවත් මෙයින් සහතික කරමි.

____________,
අයදුම්කරුගේ අත්සන.

දිනයः____________,

20. පාසල්/පිරිවෙන් අපේක්ෂකයන් සම්බන්ධයෙන් විදුහල්පතිගේ/පිරිවෙන් අධිපති හිමිගේ ප්‍රකාශය

මෙම අයදුම්කරු මෙම පාසලේ/පිරිවෙනේ ශිෂ්‍යයෙකු වශයෙන් අ. පො. ස. (සා. පෙ.) විභාගයට/හා අ. පො. ස. (උ. පෙ) විභාගයට/ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයට පෙනී සිටි බවත්, අයදුම්කරු විසින් ඉහත දක්වා ඇති විස්තර මාගේ දැනුමේ හැටියට නිවැරදි බවත් විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති නිල ප්‍රතිඵල සටහන අනුව ................ වර්ෂයේ අ. පො. ස. (උ. පෙ) විභාගයේදී අයදුම්කරු ලබාගෙන ඇති /Z අගය ....... (අකුරෙන්) ....................... බවත් සහතික කරමි.

____________,
විදුහල්පති/පිරිවෙන් අධිපති හිමිගේ
අත්සන හා නිල මුද්‍රාව.

විදුහල්පති/පිරිවෙන් අධිපති හිමිගේ නම :____________,
පාසලේ/පිරිවෙනේ නම හා ලිපිනය :____________,
දිනය :____________,

21. පෞද්ගලික අපේක්ෂකයන් සම්බන්ධයෙන් ප්‍රකාශය

විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති නිල ප්‍රතිඵල සටහන් අනුව ....................... වර්ෂයේ අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී මා ලැබූ ඒකාබද්ධ ලකුණු / Z ලකුණ .............................. (අකුරෙන්) ...................... බව සහතික කරමි.

____________,
අයදුම්කරුගේ අත්සන.

දිනය: ____________,

මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

____________,
සාමදාන විනිශ්චයකාර තැනගේ අත්සන.

නම :

නිල මුද්‍රාව :

දිනය: ____________,

05-356

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.